"ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය."

(පිලිප්පි 2:11)



# 2021 වෙසක් මස 22 වන දින

# ශුද්ධාත්ම ආගමන පුබුදු ජුබිලි මංගල මහෝත්සවය

# පෙර වදන

2021 ශුද්ධාත්ම ආගමන ස්වර්ණ ජයන්ති ජුබිලි මංගල මහෝත්සවය කොරෝනා වසංගතය නිසා අපට පැවැත්වීමට සිදුව ඇත්තේ සෞඛ්‍යාරක්ෂක නීති රීති පිළිපදිමිනි. 2019 වසරේ පාස්කු ප්‍රහාරය නිසා ද 2020 වසරේදී කොවිඩ් උවදුර නිසා ද එම වසරවල දී සංඝ ලෙස හා පවුල් ලෙස ද ශුද්ධාත්ම මංගලෝත්සව පැවැත්වීමු. මේ වන විට මෙම ව්‍යසනය දරුණු ලෙස අප රට තුළ ව්‍යාප්ත වෙමින් පවතින කාලපරිච්ඡේදයක් බැවින් පවුල් වශයෙන් හා තනිව සිටින අය තම නිවෙස්වල සිටිමින්ම ජුබිලි මංගල මහෝත්සවය සැමරීමට අපි යෝජනා කරමු.

"පොත් පිංචක්" මෙලෙස ඔබ අතට පත් කරනුයේ, zoom තාක්ෂණය මගින් හෝ DVD තැටිය මඟින් හෝ YouTube මඟින් හෝ මංගලෝත්සවයට සහභාගි විය නොහැකි අය වෙනුවෙනි.

කෙසේ හෝ වේවා අපගේ අරමුණ වසර 50 ක් පුරා අපව රැගෙන ආ සුදතුම් ගමන ගැන දෙවි සමිඳාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා කිරීමයි. එලෙසම 2021 මැයි මස 22 දින සිට ඇරඹෙන නව යුගයට නව පෙන්තකොස්තයක් ඉල්ලා යාච්ඤා කරමු. මංගලෝත්සවය තුළ ශුද්ධාත්ම ස්නාපනයක් අත්දකිමින් පවතින වසංගතයට ශක්තිමත්ව, ධෛර්යමත්ව මුහුණ දෙමු. අසරණ වී රෝගී වී සිටින අය සමඟින් සාංඝික වීමට මාර්ග සොයාගමු. මුළු ලොව, අපගේ දේශය, ශුද්ධවූ සභා මාතාව, පුබුදුව උදෙසා යාච්ඤා කරමු.

# පොදු උපදෙස්

- මැයි මස 22 දින රාත්‍රී 7.00 සිට මධ්‍යම රාත්‍රිය දක්වා අපි සියළු දෙනාම, මුළු පුබුදු ජනතාව ම එකම වේලාවක එකට සාංසික වෙමු. මංගලෝත්සවය අප නිවස තුළ පවත්වන්නට සූදානම් වෙමු.
- අප සැම දෙනාම නිවසේ අප යාච්ඤා කරන ස්ථානය ශුද්ධ බයිබලය, මල්, පහන් ආදිය තබා මංගලෝත්සවය සඳහා කලින් සූදානම් කර ගන්න.
- පවුලක් ලෙස සුදු ඇඳුමෙන් සැරසී යාච්ඤාවෙන් හා ප්‍රශංසාවෙන් යුතුව දෙවි මහෝත්තමයාණන් වහන්සේ අභිමුව පෙනී සිටිමින් ශුද්ධාත්ම ස්නාපනයක් ලබන්නට බලාපොරොත්තුවෙන් යාච්ඤා කරමු.
- ඔබ නිවස තුළ පවත්වන ශුද්ධාත්ම ආගමන ජුබිලි මංගල මහෝත්සවය පවුලක් ලෙස හෝ සමහරවිට ඔබ නිවසේ තනිවම සිටින්නේ නම් හෝ ඔබ මංගල්‍යයට සහභාගි වන ආකාරය පිළිබඳව කලින් තීරණය කර ගන්න.
- ඔබ ජුබිලි මංගල මහෝත්සවයට සහභාගි වන ආකාරය DVD තැටිය මඟින් හෝ YouTube මඟින් නම්, ප්‍රශංසාව සහ ආලෝකයේ මෙහෙය සඳහා දෙනු ලබන මඟ පෙන්වීම් වලින් පසුව DVD තැටිය හෝ YouTube වාදනය නවත්වා පවුලක් ලෙස ප්‍රශංසාවට සහ ආලෝකයේ මෙහෙයට වැඩි වෙලාවක් ඇතුල් වී නැවත ඉදිරි පියවර වලට ඇතුළු වන්න.
- Zoom තාක්ෂණය ඔස්සේ සහභාගි වන අයට ප්‍රශංසාවට, ආලෝකයේ මෙහෙයට සහ දිව්‍ය පූජෝත්සවයට ද සජීවීවම සහභාගි විය හැකි වෙයි.

- “පොත් පිංච” පමණක් භාවිතා කරගෙන මංගල මහෝත්සවයට සහභාගි වන්නේ නම්, කාලසටහනට අනුව එක එක කොටස් මෙහෙය වීම සඳහා හැකිනම් පවුලේ සාමාජිකයන් සමඟ එම කොටස් බෙදාගෙන සිදු කරන්න.
- ආලෝක මෙහෙය සඳහා ඉටි පහන් කලින් සූදානම් කර ගන්න. ආලෝක මෙහෙය අවස්ථාවේ මුලින්ම දැල්වීම සඳහා පොල්තෙල් පහනක් (පාස්කු ඉටි පහන වෙනුවට) සූදානම් කර තබාගන්න.
- රාත්‍රි 9.15 සිට 9.45 දක්වා ගරු. ඇලෙක්ස් නිලන්ත පියතුමාගේ දේශනයට පසුව (විනාඩි 30) විවේක කාලය ලෙස ගත කළ හැකිය. එම කාලය තුළ DVD තැටිය, YouTube වාදනය නවත්වා විවේක කාලය ගත කළ හැකිය. එහෙත් Zoom විකාශනය සජීවීව සිදු කෙරෙන නිසා නියමිත වෙලාවට (රාත්‍රි 9.45 ට) ආරම්භ කෙරෙන බැවින් එයට සම්බන්ධ වීමට රාත්‍රි 9.40 වන විට සූදානම් වන්න.
- Zoom තාක්ෂණය මඟින් සම්බන්ධ වීම සඳහා Link එක පහත දක්වා ඇත. මෙම Link එක මංගලෝත්සව දිනට පෙර දින දී සාංඝික භාර තාත්තලාට WhatsApp මඟින් ලබා දෙන්නෙමු.

- Zoom තාක්ෂණය මගින් සම්බන්ධ වීම සඳහා Link එක පහත දක්වා ඇත.

Topic: කිතු දන පුබුදු ශුද්ධාත්ම ආගමන ස්වර්ණ ජයන්ති මංගල මහෝත්සවය 2021

Time: May 22, 2021 07:00 PM

Sri prasansaramaya, Walpola, Ragama, Sri Lanka.

Join Zoom Meeting

https://zoom.us/j/91414084251?pwd=SWVWT3k0QVRCaEhQM1c0ZkxtVStmQT09

Meeting ID: 914 1408 4251

Passcode: Kithu

**"ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය."**

**(පිලිප්පි 2:11)**

## කිතු දන පුබුදුව - ස්වර්ණ ජයන්ති ජුබිලි - ශුද්ධාත්ම ආගමන මංගල මහෝත්සවය

## 2021 වෙසක් මස 22 වන ශනි දින

ප.ව. 07.00 - 07.05 - "ස්වර්ණ ජයන්ති ජුබිලි වසර" හැඳින්වීම
(කාලය විනාඩි 05 යි)

ප.ව. 07.05 - 07.12 - තේවාව (කාලය විනාඩි 07 යි)

ප.ව. 07.12 - 07.20 - ආරාධනාව (කාලය විනාඩි 08 යි)

ප.ව. 07.20 - 07.25 - ප්‍රශංසාවට හැඳින්වීම
(කාලය විනාඩි 05 යි)

ප.ව. 07.25 - 07.30 - ශුද්ධවූ ත්‍රිත්වයට නමස්කාරය
(කාලය විනාඩි 05 යි)

ප.ව. 07.30 - 08.30 - ප්‍රශංසාව - (කාලය පැය 01 යි)

ප.ව. 08.30 - 08.32 - ආත්මික අධ්‍යක්ෂ ගරු රොබින්සන් විජේසිංහ පිය දේශනයට හැඳින්වීම
(කාලය විනාඩි 02 යි)

ප.ව. 08.32 - 08.47 - ආත්මික අධ්‍යක්ෂ ගරු රොබින්සන් විජේසිංහ පිය දේශනය
(කාලය විනාඩි 15 යි)

ප.ව. 08.47 - 08.50 - භරත නැටුම සඳහා හැඳින්වීම
(කාලය විනාඩි 03 යි)

ප.ව. 08.50 - 08.58 - භරත නැටුම (කාලය විනාඩි 08 යි)

ප.ව. 08.58 - 09.00 - ගරු ඇලෙක්ස් නිලන්ත පිය දේශනයට හැඳින්වීම (කාලය විනාඩි 02 යි)

ප.ව. 09.00 - 09.15 - ගරු ඇලෙක්ස් නිලන්ත පිය දේශනය (කාලය විනාඩි 15 යි)

ප.ව. 09.15 - 09.45 - විවේක කාලය (කාලය විනාඩි 30 යි)

ප.ව. 09.45 - 09.48 - ස්වාමි තාත්තා පිළිබඳ කෙටි වාර්තා වැඩසටහන හැඳින්වීම

(කාලය විනාඩි 03 යි)

ප.ව. 09.48 - 10.00 - ස්වාමි තාත්තා පිළිබඳ කෙටි වාර්තා වැඩසටහන (කාලය විනාඩි 12 යි)

ප.ව. 10.00 - 10.02 - නර්ථනය සඳහා හැඳින්වීම

(කාලය විනාඩි 02 යි)

ප.ව. 10.02 - 10.10 - නර්ථනය (කාලය විනාඩි 08 යි)

ප.ව. 10.10 - 10.12 - තේමා දේශනය සඳහා හැඳින්වීම

(කාලය විනාඩි 02 ය)

ප.ව. 10.12 - 11.12 - තේමා දේශනය (කාලය පැය 01 යි)

ප.ව. 11.12 - 11.22 - තේමා ගීය ගායනය

(කාලය විනාඩි 10 ය)

ප.ව. 11.22 - 11.30 - ස්වර්ණ ජයන්ති ජුබිලි සඟරාව දොරට වැඩුම (කාලය විනාඩි 08 ය)

ප.ව. 11.30 - 11.35 - ආලෝක මෙහෙය සඳහා හැඳින්වීම (කාලය විනාඩි 05 යි)

ප.ව. 11.35 - 01.00 - ආලෝක මෙහෙය

(කාලය පැය 01 විනාඩි 25 යි)

පෙ.ව. 01.00 - 02.15 - දිව්‍ය පූජෝත්සවය

පෙ.ව. 02.15 - 2.30 - පුබුදු තේමා ගීය

- ජාතික ගීය

# ආරාධනා !

## ශුද්ධාත්ම ආගමන පුබුදු මංගල මහෝත්සවය - 2021

## "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය."

සකළ විශ්වයේ මැවුම්කරුවාණන් හා පැවැත්මයාණන් ද,
පරම ප්‍රේමයේ සුපරිශුද්ධ උල්පත ද වන
සර්ව බලධාරී දෙවි මහෝත්තමයාණන් වහන්සේගෙන් ද,
ඔවුන් වහන්සේගේ ඒ මහා ප්‍රේමණීය දෙනෙතින් මිනිස් වග දෙස බලා
තමන් වහන්සේගේ මහා තේජශ්‍රීයට ඔවුන් ද පංගුකාරයින් කර ගනු සඳහා
මෙලොවට එවා වදාළ ඔවුන් වහන්සේගේ ඒකජනිත පුත්‍රයාණන් වූ,
අපගේ ගැළවුම්කාරයාණන් හා මිදුම්කාරයාණන් ද වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගෙන් ද,
මේ මහා අති උත්තරීතර වූ පිය පුත් සබැඳියාවේ පරිපූර්ණතාවය වන
ලොව ශුද්ධවත් කරමින් රැගෙන යන්නාවූ
සුවිශුද්ධවූ ආත්මයාණන් වහන්සේගෙන් ද අවසර පතමින්
එම අති උතුම් වූ ත්‍රිත්ව ඒක දෙවි මහෝත්තමයාණන් වහන්සේට
දෝත් මුදුන් දෙමින් අපි නමස්කාර කරමු.
නමස්කාර වේවා! නමස්කාර වේවා! නමස්කාර වේවා! ....

(ජය සක් හඬ නැගේ)

ගෙවී ගිය වසර පුරා "මරියෝත්තමාවෙනි !
පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ඔබ වසා ගන්නේය"

යන තේමාව මුල්කර ගනිමින්,
දේව මාතාවන් වූ මරියෝත්තමාවන් වසා ගත්
ශුද්ධාත්මයාණන් වහන්සේගේ වසා ගැනීමේ අත්දැකීමට අවදි වූ කිතු දන පුබුදු ජනතාව,
පනස් වසරක් පුරා තමන් රැගෙන ආ අබ්බා පියාණන් වෙත තම භක්ති ප්‍රණාමය පුදමින්
වදනින් හා ක්‍රියාවෙන් තම පුබුදු දිවිය අලුත් කරගෙන
සමිඳාණන් වහන්සේගේ නාමයට සාක්ෂි දරන්නට සැරසී සිටින්නාහ. ඒ සඳහා
පුබුදු ජීවිත ගමන ආරම්භයේදී සමිඳාණන්ගේ ස්වාමිත්වය පිළිගනිමින් කළාවූ ගිවිසුම
යළි තහවුරු කර ගනිමින්,
**"ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය"** යන තේමාවෙන්
සිය ස්වර්ණ ජුබිලි වර්ෂය අරඹන්නට, ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරම් පතා සිටින්නාහ.
එබැවින්,
ශ්‍රී ක්‍රිස්තු වර්ෂයෙන් 2021 ක් වු වෙසක් මස 22 වන ශනි දින වන අද දින
නව පෙන්තකොස්තයක් පතා ඒකාත්මික වී සිටින,
ගිහි පූජක පැවිදි උතුමනි, කිතු දන පුබුදු ජනතාවෙනි, ඔබ සැමට
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වයට තම ජීවිත පවරා දෙමින්
එළැඹෙන නව ශුද්ධාත්ම වසර පුරාම ඔවුන් වහන්සේ තුළ දිවි ගෙවමින් සාක්ෂි දරන්නට
මේ ශුද්ධවු රාත්‍රිය ආශිර්වාදයක් ම වේවා"යි පතමින්
ශීර්ෂ ප්‍රණාමයෙන් යුතුව කරන්නෙමු මෙසේ -
ආ.... රා.... ධ.... නා.... !!!

# ප්‍රශංසාවට හැඳින්වීම

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය. ක්‍රිස්තුන් වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි මේ රාත්‍රිය අප සියලු දෙනාට ම අති සුවිශේෂ වූ රාත්‍රියක්, මන්ද, අපගේ ජුබිලි මංගල රාත්‍රිය යි. පෙන්තකොස්ත අත්දැකීමට අපි සහභාගි වෙන රාත්‍රිය යි. එබැවින් ප්‍රේමවන්තයෙනි, මේ මොහොතේ අපි සූදානම් වෙමු වසර 50 ක කාලයක් පුරා අප රැගෙන ආ සමිඳාණන් වහන්සේට පුබුදු ගමන මුල්කරගෙන, සුදතුම් ගමන මුල්කරගෙන ඔවුන් වහන්සේට නමස්කාරය පුද කරන්නට. ඔවුන් වහන්සේට තුති පැසසුම් පුද කරන්නට.

ප්‍රේමවන්තයෙනි, මුළු ගමන පුරාම ආරම්භයේ සිට මේ මොහොත දක්වාම අපි සමිඳාණන් වහන්සේව බලගතුව ම අත්දැක්කා. අපේම ඇස්වලින් අපේම දෑස් වලින් අපි සමිඳාණන් වහන්සේව දුටුවා. අපේ විශ්වාසයේ ඇස්වලින් අපි උන් වහන්සේව දුටුවා. සමිඳාණන් වහන්සේගේ බලගතු ක්‍රියා තුළින් අපි ඔවුන් වහන්සේව අත්දැක්කා. අපේ දෙසවන් තුළින් ප්‍රේමවන්තයෙනි, අපි සමිඳාණන් වහන්සේගේ හඬට සවන් දුන්නා. අපි ඔවුන්වහන්සේගේ ශුද්ධවූ වචන වලට සවන් දුන්නා. සමිඳාණන් වහන්සේ බලගතුව ම මුළු ගමන පුරාම අප සමඟ වැඩ වාසය කළා. සමිඳාණන් වහන්සේ අප සමග වැඩ සිටිමින් ඔවුන් වහන්සේගේ ශුද්ධවූ හස්තයෙන්, බලගතු හස්තයෙන් ඔවුන් වහන්සේ අපට රැකවරණය දුන්නා. අපට සුරක්ෂිතභාවය දුන්නා. සමිඳාණන් වහන්සේ බලගතු හස්තයෙන් ඔවුන් වහන්සේ ජනතාව ස්පර්ශ කරමින් අපට ඔවුන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් අපව ඔවුන් වහන්සේ ප්‍රබෝධමත් කළා. ප්‍රේමවන්තයෙනි කොන්දේසි විරහිත සමිඳාණන් වහන්සේගේ ප්‍රේමයාණන්

වහන්සේගෙන් ඔවුන්වහන්සේ නිරන්තරයෙන් ම මුළු ගමන පුරා ම අපගේ සිත් ඔවුන් වහන්සේ පුරවනු ලැබුවා. කොන්දේසි විරහිත වූ ආදරයෙන් සමිඳාණන් වහන්සේ අපට අසීමිත ලෙස, ජනතාවට සෑම මොහොතක දී ම ආදරය කළා. අපගේ පාපයේ වහල් කමින් මිදීම දානය කළා. ප්‍රේමවන්තයෙනි, අපට අලුත් ජීවිත පැවැත්මක් දුන්නා. අපට ජීවිත දැක්මක් දුන්නා. අපට දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳව දර්ශනයක් දුන්නා. අපට සමිඳාණන් වහන්සේ බෙහෙවින්ම ආදරය කරමින් අප සමඟ උන් වහන්සේ වැඩ වාසය කරමින් සමිඳාණන් වහන්සේගේ දයාව කරුණාව මුළු ජනතාවට මුළු වසර පනහක ගමන පුරා අත්දකින්නට, අත්විඳින්නට උන්වහන්සේ සැලැස්වූවා.

ප්‍රේමවන්තයෙනි, අපි දුබල ජනතාවක් එහෙත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය කරණකොටගෙන අපි කිස්තු කේන්ද්‍රීය ජනතාවක්. සමිඳාණන් වහන්සේගේ ස්වාමිත්වය කරණකොටගෙන දෙවියන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත, ශුද්ධවූ අභිප්‍රාය සොයන, ඉටු කරන දේව කේන්ද්‍රීය ජනතාවක්. එබැවින් ප්‍රේමවන්තයෙනි මුළු ගමන පුරාම කුරුස පාමුල සිටිමින් කුරුස පාමුල රැඳෙමින් භාග්‍යවන්ත අම්මා සමග ඒ අත්දැකීමට භාජනය වෙන්නට ඔවුන් වහන්සේ අපට ලොකු වරප්‍රසාදයක් දුන්නා.

ප්‍රේමවන්තයෙනි, එබැවින් අපගේ ජීවිත දෙස බලද්දී අපි මහෝත්තමයාණන් වහන්සේට මේ ශුද්ධවූ රාත්‍රියේදී, මේ ගාම්භීර මොහොතේ ස්තුති ප්‍රශංසා කරන්නට ඕනේ. මක්නිසාද ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසට සහභාගි වන්නට ඔවුන් වහන්සේ අපට බලගතු වරප්‍රසාදයක් දුන්නා. එනම් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරයෙක් වන්නට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මරණයේ පංගුකාරයෙක්

වෙන්නට. උන්වහන්සේගේ උත්ථානයේ බලය අත් දකින පංගුකාරයෙක් වෙන්නට, සමිඳාණන් වහන්සේගේ මුළු ගමන පුරාවට ම අපිට උන් වහන්සේගේ වරප්‍රසාදයක් දුන්නා.

එසේම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය තුළ අපි ඒ සමිඳාණන් වහන්සේ වෙතම නෙත් යොමා ගමන් කරන්නට උන්වහන්සේ අපට ලොකු වරප්‍රසාදයක් දානය කළා. එබැවින් සභාවේ පිබිදීමේ කාර්යයේ අප ජනතාව නියැළුණා. සමාජයට ප්‍රේම කරන්නට සමිඳාණන් වහන්සේ අපව අවදි කළා. එබැවින් භාග්‍යවන්ත අම්මා සමඟ අපි ගමන් කළ මේ වසර පනහක ගමන තුළ මහෝත්තම වූ සමිඳාණන් වහන්සේට අපේ මුළු හදවතින්, මුළු ආත්මයෙන්, මුළු සිතින් අපි ඔවුන් වහන්සේට ප්‍රශංසා කරමු. එබැවින් ප්‍රේමවන්තයෙනි, මේ රාත්‍රියේ අපි සමිඳාණන් වහන්සේගේ අබියසට ගමන් කරමින් අපි යාච්ඤා කරමු. උන්වහන්සේට අපේ මුළු සෙනඟ, ජනතාව වෙනුවෙන් අපි සමිදාණන් වහන්සේට මේ මොහොතේදී මුළු සිතින් යාච්ඤා කරමු. ජනතාව තුළ, ජනතාව අතර සිටින්නාවූ තැළුනු, බිඳුණු සිත් ඇත්තන්ට සිත් සුවය දානය කරන්නට කියලා අපි යාච්ඤා කරමු.

සමිඳාණන් වහන්සේට මැරුණු, ඇල්මැරුණු ජීවිතවලට මේ රාත්‍රියේ බලයක් දානය කරන්නට කියලා ප්‍රබෝධමත් කරන්නට කියලා. අපි යාච්ඤා කරමු. සමිඳාණන් වහන්සේට මේ මොහොතේ දී අපි කඩා වැටුණු ජීවිත වලට නවෝදයක් දෙන්නට කියලා. අපි උන් වහන්සේට යාච්ඤා කරමු. එබැවින් ප්‍රේමවන්තයෙනි, එක සිතින් එක සිතින් මුළු හදවතින් ම අපි පවුලක් ලෙස සංඝයක් ලෙස පුබුදු ජනතාවක් ලෙස මහෝත්තම වූ දෙවි පියාණන් වහන්සේට අපගේ හදවතේ නමස්කාරය අපි පුද කරමු. ඔවුන් වහන්සේට

අපි ස්තුති ප්‍රශංසා කරමු. මක්නිසාද, අප මෙම ක්‍රිස්තුන් වහන්සේ තුළින් තෝරාගත් සෙනඟක් වෙමු. එසේ වන්නේ දෙවියන් වහන්සේ පෙර නියම කරගත් සැළැස්ම ලෙස සියල්ල සිදුකරන අභිප්‍රාය අනුව ය. එසේ වූයේ ක්‍රිස්තුන් වහන්සේ තුළින් ප්‍රථමයෙන් බලාපොරොත්තු ලැබූ අප ඔවුන් වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව සඳහා සිටින පිණිස ය.

- **ශුද්ධවූ ත්‍රිත්වයට නමස්කාරය**

පරමෝත්තමවූ පියාණන් වහන්සේට අපි නමස්කාර කරමු

නමස්කාර වේවා ! නමස්කාර වේවා !

පරමෝත්තමවූ පියාණන් වහන්සේට මම නමස්කාර කරමි

නමස්කාර වේවා ! නමස්කාර වේවා !

ලෝකාග්‍ර වූ පුත්‍රයාණන් වහන්සේට අපි නමස්කාර කරමු

නමස්කාර වේවා ! නමස්කාර වේවා !

ලෝකාග්‍ර වූ පුත්‍රයාණන් වහන්සේට මම නමස්කාර කරමි

නමස්කාර වේවා ! නමස්කාර වේවා !

පරිශුද්ධ වූ ආත්මයාණන් වහන්සේට අපි නමස්කාර කරමු

නමස්කාර වේවා ! නමස්කාර වේවා !

පරිශුද්ධ වූ ආත්මයාණන් වහන්සේට මම නමස්කාර කරමි

නමස්කාර වේවා ! නමස්කාර වේවා !

- **ආරම්භක ප්‍රශංසාවට ඇතුළු වන්න.**

## කිතු දන පුබුදු ආත්මික අධ්‍යක්ෂක අතිගරු රොබින්සන් විජේසිංහ පියතුමන්ගේ දේශනයට ආරාධනය

වසර 50ක් පුරා අප පැමිණි ගමන් මග තුළ අපට එඬේරිකත්වය ලබා දුන්නේ අප ආදරණීය ස්වාමි තාත්තා ය. වර්තමානයේ එම එඬේරිකත්වය අපට ලබාදෙන කිතු දන පුබුදු ආත්මික අධ්‍යක්ෂක පියතුමා වන අතිගරු රොබින්සන් විජේසිංහ පියතුමෙනි, සමිදාණන් පිළිබඳ වචනය කිතු දන පුබුදු ජනතාව හා බෙදාගන්නා හැටියට කෙරෙන ගෞරවනීය ආරාධනයයි මේ.

## ගරු රොබින්සන් පියතුමාගේ දේශනය

මා දයාබර සහෝදර සහෝදරියනි, දයාබර දූ දරුවනි, තරුණ තරුණියෙනි,

ගරු රීඩ් ෂෙල්ටන් පියතුමාගේ ආත්මික මෙහෙයවීම යටතේ මාගේ දයාබර මෑණියන් සමග පුබුදු ජීවිතයට ඇතුල්වීමට මා භාග්‍යය ලැබුවේ 1975 මේ වගේ මාසයක, මැයි මාසයේ පිලපිටිය ශාන්ත ආනා දෙව් මැදුරේදී. එතකොට මට වයස අවුරුදු 15යි. ඒ කියන්නේ අද වන විට අවුරුදු 45 ක පුබුදු ජීවිතයේ අත්දැකීමක් එක්ක මේ ජීවිත ගමනේ පනස් වන සංවත්සරය පවත්වන මොහොතට මාගේ යාච්ඤාව එකතු කරන්නේ ලොකු ආත්මික ප්‍රීතියකින් යුතුවයි. ලෙවී ව්‍යවස්ථාව විසිපස් වන පරිච්ඡේදයේ 8 වන වගන්තිය සිට දහතුන්වන වගන්තිය දක්වා දේව ජනතාව ජුබිලිය සැමරීම එහි අර්ථය, එහි අරමුණ පිළිබඳව අපට කතා කරනවා. අපට ලැබුණ ජීවිත නවෝදය වෙනුවෙන් මෙවන් දිනක

අපි අබ්බා දේව තාත්තට ස්තුති ප්‍රශංසා කරනවා. අපි එසේ කරන්නේ අපේ දයාබර සිරි ඔස්කා අබයරත්න නැමැති කිතු දන පුබුදු ජීවිත ගමනේ ඒ අපගේ නිර්මාතෘවරයාණන් වන දයාබර ස්වාමි තාත්තා මුල්කරගෙනයි. 1967 අමෙරිකානු දූත ගමන කතෝලික පිබිදීමේ අධ්‍යාත්මික ජීවිත මඟ ලංකාවේ කතෝලික සභා මාතාවට හඳුන්වාදීමට 1971දී ශුද්ධාත්මයාණන් වහන්සේ තෝරගත්ත ජීවිතය ස්වාමි තාත්තාගේ ජීවිතය යි. ස්වාමි තාත්තාගේ ජීවිතය හා පැවැත්ම තුළ අපි හඳුනාගත්ත ඒ ජීවිත ක්‍රමය අප දේශයේ වටිනාකම් හා සම්ප්‍රදායන් මුල් කරගෙන අපට ලබා දීම ගැන අපි දෙවි මහෝත්තමයාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු.

ලෝකයේ පළමු සහ සුවිශේෂමය ශුද්ධාත්ම ව්‍යාපාරය හා ජීවිත ගමන කතෝලික සභා මාතාව බව අපි හොඳින් දන්න කාරණාවක්. ඒ සභා මාතාව තුළ බිහිවන සෑම ජීවිත ක්‍රමයක්ම සෑම කණ්ඩායමක්ම ස්වභාවයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වුණ, අවනත වන ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ බිහිවුන කණ්ඩායමක්. පිබිදීමේ ජීවිත ගමනට ඇතුලු වුණ ජනතාව ලබන අත්දැකීම ඒ සැම කණ්ඩායමක් අතරින්ම විශේෂ ස්වරූපයක් ගන්න බව අපට පැහැදිලියි. මන්ද, එය නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වුණ, අවදිවන, ඔවුන් වහන්සේගේ කැමැත්ත සොයන, දේව වචනය මත ගොඩනැගුණු ජීවිත ක්‍රමයක් බැවින්. ජුබිලි වසරේ තේමාව වන "ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමිදාණෝ" බව වටහා ගන්නට, හඳුනා ගන්නට ඔවුන් වහන්සේ පමණක් අපේ ජීවිතේ එකම ස්වාමියාණන් කරගන්නට ඒ නිසාම පාපය හඳුනාගෙන, පාපය අත්හරින්නට ශුද්ධාත්මයාණන් වහන්සේට පස් වරක්, හත් වරක් ඒ හා සමානව නිරන්තරයෙන්ම අවදි වන්නට, ඉඩ දෙන්නට දයාබර ස්වාමි තාත්තාගේ ඉගැන්වීම් තුළින් පෝෂණය ලබන ජනතාවක් ඔබ අප. ඒ පෝෂණය

ලබාදෙන ප්‍රේමයේ හා ආලෝකයේ වචනය ගලාගෙන එන බව අද්දකින අවස්ථාවක් මෙය. මා දයාබර සහෝදර සහෝදරියනි, දයාබර දූ දරුවෙනි, තරුණ තරුණියනි, කොරෝනා වෛරසය නිසා බියපත් වී සිටින අඩපණ වුණ සමාජ පරිසරය තුළ අද දින අප සමරන වසර 50 ආපසු හැරී බැලීමේ සැමරීමක්, ස්තුති කිරීමක්, අගය කිරීමක්.

ස්වාමි තාත්තා සමග ආරම්භයේ සිට මේ අධ්‍යාත්මික පිබිදීමේ ගමනට ඇතුල් වුන ඒ ගමන ආව, ඒ ගමන එන අතරමග විටෙක නතර වුණු සියලු දෙනාම මුල්කරගෙන අබ්බා දේව තාත්තා දෙස බලන සුවිශේෂම ය අත්දැකීමේ අවස්ථාවක්.

හිස්වෙමින් කුරුස පාමුල සිටින භාග්‍යවන්ත අම්මා වාගේ අවදිවෙමින් ජේසු සමිඳාණන් වහන්සේගේ දේවපුත්‍ර භාවයට අපගේ මනුෂ්‍ය පුත්‍රභාවය තුළ අබ්බා දේව තාත්තාගේ අභිරහස්මක සුවිශුද්ධ පැවැත්ම ඉදිරියේ පෙනී සිටිමින් වෙනස් වුනු ජීවිතයක් තුළින් උත්ථාන වූ සමිඳාණන්ට සාක්ෂි දරන්නට ශුද්ධාත්මයාණන් වහන්සේට තව තවත් අවදි වීමට ඇරයුම් ලබන වසරක ආරම්භයක්. අත්හරිමින් හිස් වන්නට, හිස් වෙමින් පිපාස වන්නට, පිපාස වෙමින් ලබා ගන්නට, ලබා ගනිමින් අයිති කරගන්නට, අයිති කර ගනිමින් ධාරණය කරගන්නට, ධාරණය කර ගනිමින් වැඩෙන්නට, වැඩෙමින් ඵල දරන්නට සැළැස්වූ ජීවිත මඟ සමරන පනස්වෙනි වසරේ ආරම්භයයි අද.

අපි එකම සභා මාතාවකගේ දරුවෝ එම කතෝලික සභාවේ කේන්ද්‍රස්ථානය උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ බව ඔබ අප හොඳින් දන්නා කරුණක්. සභා මාතාව ආරම්භ වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මහා වැගිරීමත් සමඟ බව අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ දෙවන පරිච්ඡේදය

අපට නිරන්තරයෙන් කියාදෙන සුභ වදනක්. සභා මාතාව කියන්නේ දේව ජනතාවයි. දේව ජනතාව යන්නෙන් අදහස් කරන්නේ ගිහි ජනතාව සහ පැවිදි පූජකවරුන්. පැවදි පූජකවරුන් බිහිවන්නේ ඔබේ පවුල් වලින්. ඒ කියන්නේ ගිහි ජනතාව අතරින්. ඒ නිසා ගිහි ජනතාව හා පැවිදි පූජක ජනතාව එකම ශ්‍රේෂ්ඨත්වයක් දරන බව්තීස්ම-ස්නාපනය තුළින් අරඹා වෙනස් වූ කැඳවීම් තුළින් එකම සභා මාතාවට එකම දේව ජනතාවට සේවය කරන ජනතාවක් අපි. දේව වචනයෙන් පෝෂණය වෙමින් ශුද්ධ වූ සභාවේ ඇල්මැරුණු ජනකොටස් පෝෂණය කරන උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණන් කරගනිමින් ලබාගන්න ජීවිත වෙනස, ඒ සතුට ඒ නැවුම් භාවය ලොවට කියාදෙන ජනතාව පුබුදු ජනතාවයි.

මෙම ඔබ, අපගේ අත්දැකීම පුබුදු ජීවිත අත්දැකීමයි. සියල්ල අත්හැර දේව කැමැත්තට ඉඩ දෙමින් බලා සිටින්නටත්, බලා සිටිමින් අවනත වෙන්නටත්, අවනත වෙමින් සිටිනා තැනින් සිටිය යුතු තැනට යන්නටත් අරඹන පනස් වන ජුබිලි වසර තුළ ස්වාමි තාත්තාගේ නිහඬ ජීවිත යාච්ඤාව අපි ප්‍රාර්ථනා කරමු. ස්වාමි තාත්තාව මට වඩා හොඳට ඔබ තාත්තව හඳුනන ජනතාවක්. ඒ තාත්තාගේ අභියෝගාත්මක ඉගැන්වීම් වලට සහ පියවරවල් වලට අපි ඉඩ දෙමු. තාත්තගේ නිහඬ මැදිහත්කම ප්‍රාර්ථනා කරමු. මන්ද බියවන්නට, සැලෙන්නට, වැටෙන්නට හේතු කාරණා නැත. මන්ද ජේසු ස්වාමීන් වහන්සේ ස්වාමියාණෝ ය. ඔබ සියලු දෙනාටම ගොඩක් ගොඩක් ස්තූතියි ! ජේසු පිහිටයි !

## ගරු ඇලෙක්ස් නිලන්ත පියතුමන්ගේ දේශනයට ආරාධනය

කිතු දන පුබුදු ජනතාව හා නිරන්තරයෙන්ම බැඳෙමින් දේව තාත්තාගේ සුවිශේෂීය, ස්වර්ගීය, ආත්මික අනාවරණයන් අපට හෙළිදරව් කරන්නාවූ හලාවත පදවියේ ගරු ඇලෙක්ස් නිලන්ත පියතුමෙනි, මේ ජුබිලි මංගල මහා රාත්‍රියේ ස්වර්ගීක, ආත්මික අනාවරණයන් දැනගන්නට අප පුබුදු ජනතාව ඉමහත් ආශාවෙන් බලා සිටිනවා. ඒ ස්වර්ගීක වූ ආත්මික අනාවරණයන් අප හා බෙදා ගන්නට ගෞරවයෙන් කරන ඇරයුමයි මේ.

## ගරු ඇලෙක්ස් නිලන්ත පියතුමන්ගේ දේශනය

ෂාලොම් !

පනස් වසරක පුබුදු ගමනට සමිඳාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා කරන මේ පින්බර රාත්‍රියේ ක්‍රිස්තුන් වහන්සේ අපගේ එකම සමිඳාණෝ ය, "ක්‍රිස්තුන් වහන්සේ අපේ ජීවිතයේ ස්වාමියාණෝ ය" යන තේමා වදන මුල්කරගෙන ඔබ සමඟ සුභාරංචිය බෙදාගන්නට මේ ලැබුණු මොහොතට ස්වාමින් වහන්සේට හදවතින්ම ස්තුති ප්‍රශංසා කරනවා. අපි මෙවර මේ තේමාව සමග මෙනෙහි කරන්නේ වෙනදට වඩා භයංකර, අන්ධකාරයේ පරිසරයක් තුළ ඉඳගෙනයි. එක පැත්තකින් මුළු ලෝකයම වෙලාගෙන තිබෙන මේ කොරෝනා වසංගතයත් අනෙක් පැත්තෙන් පීඩනය සහ මර්දනය හමුවේ ක්‍රිස්තියානි ජනතාවට අත්දකින්නට සිදුවුණු ඒ අවාසනාවන්ත තත්ත්වයේ යුක්තිය ඉල්ලා මොර ගසන පරිසරයේ ද අනෙක් පැත්තෙන් මේ පින්බර මව් බිමෙහි

ස්වභාධර්මය, ස්වභාව සෞන්දර්යය විනාශ කරමින් හතර අත දිව යන භයංකර විනාශකාරී රැල්ලක් හමුවෙහිත් අපි මෙවර ශුද්ධාත්ම මංගල්‍යයේ මේ තේමාව සමඟ භාවනා කරන්නේ. නමුත් අපි විශ්වාස කරනවා තවමත් අපේ එකම ස්වාමියාණෝ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පමණයි. මේ අන්ධකාර පැයේදී ත් මේ භයානක පරිසරයේදී ත් අපගේ සමිඳාණෝ ක්‍රිස්තුන් වහන්සේම යි කියන සුභාරංචිය හදවතේ දරාගෙන අපගේ පනස්වන වසර පසු කරමින් යන ගමනේ ස්වාමින් වහන්සේට තුති පුදනවා.

මේ තේමාව අපට ලැබෙන්නේ ශු.පාවුලු තුමා පිලිප්පි වරුන්ට ලියන ලද හසුනේ දෙවන පරිච්ඡේදයේ පළමු වගන්තියේ සිට එකොළොස් වන වගන්තිය දක්වා කොටසේ ය. පිලිප්පි සංඝයේ අත්දැකීම මොකක් ද? පිලිප්පි සංඝය රෝම අධිරාජ්‍යයේ ප්‍රධාන නගරයක් හැටියට සුභාරංචිය ඇසූ පමණින් ස්වාමීන් වහන්සේව අදහා ගත්තු ශු.පාවුලු තුමාගේ හදවතේ රැඳුණු ආදරණීය සංඝයක්. ශු.පාවුලු තුමාට සුභාරංචියේ ප්‍රීතිය පමණක් නොවේ භෞතිකවත් සභාව, සංඝය ගොඩනඟන්නට උදව් වූ සුවිශේෂී සභාවක් පිලිප්පි සභාව කියලා කියන්නේ. නමුත් ඔවුන්ගේ අත්දැකීම මොකක් ද? සමහර බයිබල් විශාරදයන් කියන පිළිවෙළට ක්‍රිස්තු වර්ෂ 62 වගේ කාලයේ දී ශු. පාවුලු තුමා මේ හසුන ලින්නට ඇති. ඒ අත්දැකීම තමයි රෝම අධිරාජ්‍යය තුළ නීරෝ අධිරාජ්‍යයාගේ පීඩනය හමුවේ බොහෝ දෙනෙකුගේ ජීවිතය ක්‍රිස්තු සුභාරංචිය වෙනුවෙන් ජීවිත පූජා කරපු පරිසරයකයි මේ වචනය ස්වාමීන්වහන්සේ තුළ ඉඳගෙන ශු.පාවුලු තුමා පිලිප්පි සංඝයට ලියන්නේ. මේ වචනය ගැන සහා අත්දැකීම විග්‍රහ කරන බයිබල් විශාරදයෝ පවසන්නේ මෙය ක්‍රිස්තුවේදීය ගීතයක් හැටියටත් අනෙක් පැත්තෙන් එහි ඇති සභාවේදීය අත්දැකීමත් හරිහැටි තේරුම් ගත්තොත්

මේක ඇතුලෙන් ගලාගෙන යන කරන්ට් එක නැත්නම් දිය දහරාව වෙන මොකුත් නෙවෙයි බව්තීස්ම-ස්නාපන කැඳවීමේ තිබෙන ගැඹුර යැ"යි බයිබල් විශාරදයෝ පැහැදිලි කරනවා. බව්තීස්ම-ස්නාපනය තිබෙන්නේ කොතැනද එතැන ආත්මයාණන් වහන්සේගේ ස්නාපනය තිබෙන බව මුල් කිතුනු සංඝයේ අත්දැකීමයි. ඒ නිසා පිලිප්පි සංඝයට මේ වචනය "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය" යන වචනය මතක් කරමින් ශු.පාවුලු තුමා මොකක්ද කියන්න හදන්නේ ඔබ මා එක්සිත් කරන ශුද්ධාත්මයාණන් වහන්සේම සහයෝගීව ඔබ මා සමග වැඩ සිටිමින් මේ අත්දැකීමට ඔබව මාව එකතු කරත්වා යන ප්‍රාර්ථනය ඇතිවයි ශු. පාවුලු තුමා පිලිප්පි සංඝයට මේ වචනය කියන්නේ. එතකොට මතක් කරනවා ඔබේ බෞතිස්ම කැඳවීම, ඔබ බව්තීස්ම-ස්නාපනය ලැබුවේ ජීවමාන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන්. ඒ නිසා මේ ස්වාමිත්වයට ඔබ නතු වෙනවා කියන්නේ ඒ ඔබේ විශ්වාසය අත්දැකීම පමණක් නොවේ එය ඔබේ මුළු ජීවිතයම යි.

ඔබේ ජීවිතයේ සම්පූර්ණ අයිතිකරුවාණෝ, සම්පූර්ණ හිමිකරුවාණෝ, ඔබේ පැවැත්ම තීරණය කරන තීරකයාණෝ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ම බව නැවත නැවත පිලිප්පි සංඝයට මතක් කරනවා. ඇත්තටම මේක භයානක සුභාරංචියක්, මේක භයංකර වචනයක්, ඇයි ඒ ? ක්‍රිස්තුන් වහන්සේට ස්වාමිත්වය පවරා දෙනවා කියලා කියන්නේ එතනින් එහාට මගේ අයිතිය, මගේ කැමැත්ත, මම ගොඩනගන ජීවිත සිහිනය මට අහිමි වෙනවා . එතනින් එහාට භයංකර දෙයක් සිදුවෙනවා, මට මාව අහිමි වෙනවා, මම මගේ කියන්නැති තරමට මම මගේ නොවන තරමට, අපි අපේ නොවන තරමට අපි ස්වාමීන් වහන්සේට අයිති වෙනවා. එතනින් එහාට අපි හදාගත්තු ස්වාමිත්වය තුළ අපිට

රැඳෙන්නට අයිතිවාසිකමක් නැහැ. අපි පුද්ගලයින්ට, පුද්ගල කණ්ඩායම් වලට, කුටුම්භයන්ට, සංවිධාන වලට පවරපු අපේ ජීවිතයේ අයිතිය ක්‍රිස්තුන් වහන්සේ වන ස්වාමියාණන්ට පමණක් යන ඒ භයංකර වචනය තුළ අපි ජීවත් වෙනකොට අපිට කියලා ඉතිරි වෙන කිසිම දෙයක් නැහැ. ඇත්තටම ශු.පාවුලු තුමා මේ කතා කරන අත්දැකීම මුල් කිතුනු සභාවට නම් අමුතු අත්දැකීමක් නොවෙයි. ක්‍රිස්තු වර්ෂ 62 කියලා කියන්නේ සභා ජීවිතයේ ස්වර්ණමය යුගය පසු කරමින් හිටපු කාලයක්. ස්වර්ණමය යුගය කියලා කියන්නේ ඇයි? මුල් ශත වර්ෂ තුන ඇතුලේ ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය පිළිගත්තු දස දහස් ගණනක් උන්වහන්සේ වෙනුවෙන් ජීවිතේ පූජා කළා. වරදාන පරිත්‍යාගශීලීත්වය, ලෝකයෙන් ලැබෙන වටිනාකම, ලෝකයෙන් ලැබෙන වරප්‍රසාද, ලෝකයෙන් ලැබෙන අගය කිරීම, ලෝකයෙන් ලැබෙන වටිනාකම කුණු කසළ යැ"යි සළකමින් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය ට යටත් වෙච්ච මිනිස්සු දස දහස් ගණනින් ඉදිරියට ආවා මේ වචනයේ බලය අත්දකිමින්.

ඒ නිසා මේක භයංකර වචනයක් එතනින් එහාට යක්ෂයාට තමන්ගෙ ජීවිතය ගැන බල පත්වන්න අයිතියක් නැහැ. මාංශයාට යට වෙන්නට අයිතියක් නෑ. ලෝකයාට අයිතියක් නැහැ අපේ ජීවිත පාලනය කරන්නට, මෙන්න මෙයයි කිතුනු සංඝයේ අත්දැකීම වුණේ. ඒ නිසා ශු. පාවුලු තුමා මේ ස්වාමියාණෝ ක්‍රිස්තුන් වහන්සේ පමණක්ම බව නැවත නැවතත් තහවුරු කරද්දි මුල් කිතුනු සභාවේ එහි අත්දැකීම තුළ හිටපු අය තවත් ශක්තිමත් වුණා. හයියක් ලැබුවා.

ශක්තිමත් අය මොකද කළේ ජීවිතය පරදුවට තබලා ඉදිරියට ගිහින් ජීවිතේ පූජා කළා. ශක්තිමත් නොවුණු අය

තව තවත් ශක්තිමත් වීමේ අත්දැකීමට ඇතුළු වුණා. ඒක දැකලා තව සිය දහස් ගණනක් ජනතාව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය වෙත ඇදිලා ආවා. එය ඇත්තටම ශු. පාවුලු තුමාගේ දේශනා ශක්තියවත් සභා නායකයන්ගේ සභා පරිපාලන බලයවත් එහෙම නැත්නම් ඒ ජීවත් වෙච්ච ජනතාවගේ ඒ මහ පිරිස් බලයවත් නෙවෙයි. ඉහළින් පැමිණුනු ශුද්ධාත්මයාණන් වහන්සේම ඔවුන් එක් එක්තැන් කරමින් මේ ප්‍රසාද ස්නාපනීය කැඳවීමට ඇතුල් කළා. ඒ නිසා බයිබල් විශාරදයෝ කියනවා මේක ක්‍රිස්තු වේදිය ගීතිකාවක් වගේම මේක බව්තීස්ම-ස්නාපනය කැඳවීම ගැන යළි යළිත් තහවුරු කරපු ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණන් කරගත්තු මිනිස්සුන්ගේ අත්දැකීම ගැඹුරට, ගැඹුරට රැගෙන ගිය ගීතිකාවක් ද පමණක් නොව විශ්වාසයේ ප්‍රකාශනයක් කියලා.

ඇත්තටම මේ ස්වර්ණ ජයන්තිය සමරන කිතු දන පුබුදුවට, අපිට එදා ක්‍රිස්තු වර්ෂ 62 දී පිලිප්පි සංඝය පසු කරමින් හිටපු ස්වර්ණමය අත්දැකීම ලෝක මට්ටමින් එය ස්වර්ණමය අත්දැකීමක් නෙවෙයි ජීවිත ගණනාවක් මහ පොළොවට සමතලා වෙලා, ජීවිත ගණනාවක් ලේ සිඳ හෙලලා, ජීවිත ගණනාවකට තමන්ගේ ලෝක අයිතිවාසිකම පුරවැසිභාවය පවා අහිමි වෙලා ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය පමණක් ඉතුරු වෙන්න ජීවිතය පිළිබඳවත් කිසිම අයිතියක් නැති තරමට සියල්ලෙන් හිස් වෙන්න සිදුවුනු භයංකර අත්දැකීමක්. නමුත් ඒ භයංකර අත්දැකීම තමයි සභාව, සභා ජීවිතයේ ස්වර්ණමය අත්දැකීම කියලා කියන්නේ. කිතු දන පුබුදු අපිට මේ පැය ඒ වගේ භයංකර අත්දැකීමක් කියලා අපිට පේනවා, අපිට දැනෙනවා, නමුත් මා ආදර ආදර අම්මේ තාත්තේ, දුවේ පුතේ, සොයුර සොයුරිය අපි පසු කරමින් ඉන්නේ ස්වාමීන් වහන්සේගේ භයංකර කැඳවීම

අභියස. මෙය ස්වර්ණමය අත්දැකීමක් ඒ නිසා මේක හැල්ලු කරන්න දෙන්න එපා. මේක තමයි ස්වාමි තාත්තා අවුරුදු පනහක් තිස්සේ අපට දුන්නු පන්නරය. පුබුදු පන්නරය. පුබුදු ශක්තිය. පුබුදු ගමනට දුන්නු ස්වර්ණමය වටිනාකම. ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණන් කරගෙන යන ගමනේදී ස්වාමිත්වය ක්‍රිස්තුන් වහන්සේට පමණක් පුදන්නට අපට ඉගැන්වූ ස්වාමි තාත්තගේ පන්නරය එය යි.

බලන්න පුබුදු ගමනට මේ වසර 50 ඇතුලේ කීදෙනෙක් නම් ජීවිතය දීලා තියෙනවද? නිකං සාමාන්‍ය මිනිසුන් පමණක් නෙවෙයි ඉහළ තලවල නිළතල හෙබවූ සුවිශේෂී වෘත්තිකයන්, විශේෂ උගතුන් බුද්ධිමතුන් පවා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය හමුවේ ඒ සියල්ල කුණු කසළ යැ”යි කියා පැත්තකට දාලා සුදු වතින් සැරසී සමිඳුන් අතගත් ගමනක් යන්න තීරණය කරලා තිබෙනවා. ඒ පන්නරය ලැබුණේ කොහෙන්ද? කවමදාකවත් අපේ ආදර ස්වාමි තාත්තා කියන්නේ නැහැ පුබුදුව මගේ නිර්මාණයක් කියලා.

බොහෝ අවස්ථාවල පුබුදු ගමන ගැන විචාරය කරන බොහෝ දෙනෙක් ස්වාමි තාත්තගෙන් අහල තියෙනවා ඇත්තටම පුබුදුවේ නිර්මාතෘ හැටියට ඒ වචනය කියද්දී ම ස්වාමි තාත්තා ඔවුන්ව නවත්වනවා “නැහැ නැහැ පුබුදුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගේ ම, අබ්බා පියාණන් වහන්සේගේ ම, ශුද්ධාත්මයාණන් වහන්සේ ගේ ම, ස්වෛරී නිර්මාණයක් පමණයි, එය මං කරපු දෙයක් නෙවෙයි” කියලා ස්වාමි තාත්තා නිතැතින්ම ඒ වචනය කියනවා ඇයි ඒ? ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව ස්වාමියාණන් කරගෙන ස්වාමි තාත්තා ගිය ගමන ගැන උන්වහන්සේට ස්ථිරත්වයක් තිබුණා. උන්වහන්සේ කොයි මොහොතකවත් පූජක වාදය තුළවත් පූජකයන් විසින්

ම නිර්මාණය කරන සුරක්ෂිත වටපිටාවක් තුළ ඉඳගෙන ගිහියා අපට වඩා පහත් කියා සළකන්නවත් එහෙම නැත්නම් මේ ගමනට ඇතුළු වූ අලුත් අය ආධුනිකයන් කියා සළකන්නවත් එහෙම නැත්නම් ස්ත්‍රීන් පුරුෂයන් වශයෙන්වත් භාෂා භේදවත් ජාති භේදවත් සළකන්නෙ නැතිව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ එකම ස්වාමියාණන් කරගත්ත හැම පුතෙකුට ම දුවෙකුට ම හැම අම්මා කෙනෙකුට ම තාත්තා කෙනෙකුට ම හැම තරුණයෙකුට ම තරුණියකට ම හැම වෘත්තිකයෙකුට ම හැම කෙනෙකුට ම එකමුතු වෙන්න එක්සිත් වෙන්න සාංඝික වෙන්න ස්වාමි තාත්තාට ඒ ස්වාමිත්වය බලපෑවා.

ඒ නිසා ස්වාමි තාත්තා ගොඩනගපු ජනතාව මේ ස්වර්ණමය යුගයේ මේ ස්වර්ණ ජයන්තිය සමරන මේ යුගයේ මේ ලංකා දේශය පුරාත් මේ මුළු ලෝකය පුරාත් විවිධ සාංඝික වල වගකීම් ගනිමින් බොහෝ දුක් පීඩා මැද මේ පැයේදීත් පුබුදු ගමන යනවා.

ඒක තමයි ස්වාමිත්වයට නතු වෙන මිනිසුන්ගේ අත්දැකීම. ඒක තමයි පිලිප්පි සංඝයේ අත්දැකීම. ඒක තමයි වසර 312 ක් තිස්සේ කිතුනු සභාව අත්දැකපු තත්ත්වය. ඒ තමයි පීඩිත අත්දැකීම නමුත් එය ස්වර්ණමය අත්දැකීමක්. ස්වර්ග යේ ස්වර්ණමය අකුරෙන් ඒ අයගේ නම් ලියැවුණු බව සභා ජීවිතය අපට උගන්වනවා. ප්‍රාණපරිත්‍යාගිවරුන්ගේ රුධිරය නව කිතුනු සභාවේ සම්භවය යි, ක්‍රිස්තියානි විශ්වාසයේ සම්භවය යි, ප්‍රභවය යි කියලා සභාව උගන්වන්නේ ඒ නිසයි. ඒ වගේමයි මේ මොහොතේ මා අනිවාර්යෙන්ම කිව යුතු තවත් සුවිශේෂී කරුණක් තිබෙනවා. මේ ස්වර්ණ ජයන්ති වසරට පෙරත් වසර හතරක පහක මගේ අධ්‍යයනයේ දී මා සොයාගත් එකම එක කරුණක් බොහෝ වෙලාවට බොහෝ දෙනෙකුට මග හැරෙයි කියා සිතන නිසාම මා මේ

ස්වර්ණ ජයන්ති වසරේ මේ වචනය කියන්නට ඕනා. ස්වාමි තාත්තා දිවැසිවරයෙක් පමණක් නොවෙයි සැබෑම ජීවමාන ශුද්ධවන්තයෙක්. ස්වාමි තාත්තා ජීවමාන ශුද්ධවන්තයෙක්. මේ සභා ජීවිතය ප්‍රබෝධමත් කළා පමණක් නොව ප්‍රබෝධමත් කරන විධිය ප්‍රබෝධමත් විය යුතු ආකාරය. මේ සමස්ථ සභා ජීවිතයටම ප්‍රායෝගික කරණය කරනු ලැබූ ජීවමාන ශුද්ධවන්තයෙක්.

සරල අල්පේච්ඡ ජීවිතය තුළින් හිස් වෙනකොට ඒ හිස් වීමේ අත්දැකීම තුළ ඉන්න ඉන්න, රැඳෙන්න රැඳෙන්න ශුද්ධාත්මණන් වහන්සේගෙන් පිරෙනකොට තමන්ගේ කියා දෙයක් තමන්ට ඉතිරි කර ගන්නේ නැතිව සියල්ල ස්වාමීන් වහන්සේගේ ස්වාමිත්වයට පවරා දෙනකොට ස්වාමි තාත්තාගේ ජීවමාන ශුද්ධවන්තකම අපි අත්දැක්කා. ස්වාමි තාත්තා කවදාවත් තමන්ට මහිමය හිමි කරගන්නට උත්සාහ කරපු කෙනෙක් නෙවෙයි. උන්වහන්සේගේ පූජක ජීවිතය ගැන හදාරන කොට අපට පෙනෙනවා එදා ඉඳලා අද දක්වාම උන්වහන්සේ ශක්තිමත්, ප්‍රබෝධමත් ජවසම්පන්න, ජීවමාන සභාවක ජවසම්පන්න සාක්ෂි දරන ගිහියන් පිරිසක් ගොඩනැගුවා. ඒකේ හොඳම බාහිර ප්‍රකාශනය තමයි ක්‍රිස්තු වර්ෂ 1996 දී අත්හරින්න කියමින් සියලු වගකීම් වලින් හිස්වෙලා මේ ශුද්ධාත්ම ව්‍යාපාරය, මේ පිබිදීමේ ව්‍යාපාරය ගිහියන්ගේ දෑතට භාර කරා. ඒක ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය ගැන ශුද්ධවන්තයෙක් හැටියට, ජීවමාන ශුද්ධවන්තයෙක් හැටියට ස්වාමි තාත්තා තැබූ විශ්වාසයයි. ශුද්ධවන්තයෙකුට පමණයි ඒක කරන්න පුළුවන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය ඉදිරියේ තව කෙනෙකුව විශ්වාස කරන්න ගැඹුරින් විශ්වාස කරන්න බලය ලැබෙනවා. ඒක ශුද්ධවන්තයෙකුට ලැබෙන බලයක් ඒ ශුද්ධවන්තකම ස්වාමි තාත්තාගේ ජීවිතය තුළ දැක්ක නිසා තමයි එය

පෙනෙන්නට තිබූ නිසයි ස්වාමි තාත්තා ගිහියන්ගේ දෑතට මේ සුවිශේෂී පිබිදීමේ ව්‍යාපාරය බාර කළේ. අද වෙනකොට මේ ලංකාව තුළත් මුළු ලෝකය පුරාමත් අස්සක් මුල්ලක් නෑර මේ පිබිදීමේ අත්දැකීම අරගෙන ගිය බොහෝ ගිහියන්ට ස්වාමි තාත්තාගේ මේ පන්නරය, ශුද්ධවන්ත පන්නරය බලපාලා තියෙනවා. මෙතනින් වෙන්වෙලා ගිය අය වුණත් අද ස්වාමි තාත්තාගේ ශුද්ධවන්තකම ගැන "දිවැසිවර හඬ" ගැන නැවත නැවත ආවර්ජනය කරනවා. මට දැනෙනවා මේ පන්නරය ස්වාමි තාත්තට ලැබුණේ, සභාවට ම එය ලැබෙන්නට ම ඕන මොහොතකයි කියලා. ඇයි හරියටම මීට අවුරුදු 59 කට ඉස්සරලා ලංකාවට විතරක් නෙවෙයි සමස්ත ලෝකයට ම බලපාන සුවිශේෂී තීරණයක් සභා ජීවිතයේ ගනු ලැබුවා.

සභාවේ දොරගුළු විවෘත කරමින් ශුද්ධාත්ම සුළඟට සභාව ඇතුලට එන්න ඉඩ දෙමින් XXIII ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ඒ ආරාධනාව කරද්දි සභාව දෙදරුම් කෑවා. සභාවට මෙය දරන්නට බැරි වුණා. බොහෝ දෙනෙක් පූජකවරය පවා අතහැර ගියා. සභාව ගැන තැබූ විශ්වාසය අතහැරියා. නමුත් මේ වයෝවෘද්ධ ශුද්ධෝත්තම පියතුමා ශුද්ධාත්මයාණන් වහන්සේට විවෘතව සිටිමින් ඒ පන්නරය තුළ සභාවට නායකත්වය දුන්නා. නමුත් ලංකාවට මේ අත්දැකීම ගේන්නට පුරෝගාමීත්වය දෙන කවුද මේ මොහොතේ ඉන්නේ කියලා සභාව ලතවෙමින් ඉන්න මොහොතක ශුද්ධාත්මයාණන් වහන්සේ අපේ ස්වාමි තාත්තාව දෙවන වතිකාන මන්ත්‍රණ සභාව දුටු සභා සිහිනය ලංකා පොලොවෙන් ජීවමාන කරන්නට කැඳව ගත්තා. ඒ නිසා සභාව කියලා කියන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ම සක්‍රමේන්තුව යි කියලා දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ජාතීන්ගේ ආලෝකය (ලූමෙන් ජෙන්ටිසියුම්) කියන ලියවිල්ල ප්‍රකාශ කරද්දී සභාව කියලා

කියන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින්ම අපෝස්තුළුවරුන් මත ගොඩ නැගූ විශ්වාසනීය සභාවමයි. ඒ සභාවේදීය ප්‍රායෝගික ප්‍රකාශනය කිතු දන පුබුදුවෙන් මේ වෙනකොට මුළු ලෝකයටම ප්‍රකාශ කරලා ඉවරයි යන සුබ ආරංචියත් මේ මොහොතේ මම නිර්භයව ප්‍රකාශ කර සිටිනවා. ඒක මම කියන්නෙ නිකං හැඟීම්බරව කියන ප්‍රකාශයක් හැටියට නෙවෙයි වසර පහකට වැඩි මගේ දේවධාර්මික කියවීම අනුව මම දන්නවා දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට තිබූ සභා සිහිනය ක්‍රිස්තු වේදයක් මත පදනම් වූ සභා වේදයක්. ශුද්ධාත්ම වේදයකින් නිරන්තරයෙන්ම පෝෂණය වන සභා ජීවිතයත් සක්‍රමේන්තු ජීවිතයත් එක්තැන් කරපු විශ්වාසනීය සභා ප්‍රකාශනය මේ මුළු ලෝකය පුරාම 23 වන ජුවාම් පාප්වහන්සේ දැකපු සිහිනය ලංකා පොළොවෙන් ජනිත කරන්නට ශුද්ධාත්මයාණන් වහන්සේ අපේ ස්වාමි තාත්තාව තෝරාගෙන හමාරයි.

ඒක දැනටමත් මේ පොළොව මත ජීවගැන්වෙලා හමාරයි. ඒ නිසා නේද මේ මොහොතේත් පීඩන මැද, තාඩන මැද, ප්‍රතික්ෂේපයන් මැද, වේදනා, කඳුළු මැද වුණත් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය අත නොහැර "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ එකම ස්වාමියාණෝ ය" යන ඒ විශ්වාසය එදා හරියට පිලිප්පි සංඝය ක්‍රිස්තු වර්ෂ 62 දී පීඩන සමය මැද වුණත් ස්වර්ණමය යුගය තුළ පසු කරමින් හිටපු අත්දැකීම තුළ හිටිය වගේ තාමත් ස්ථිරව සිටින්නට අපේ පුබුදු ජනතාවට ලැබිලා තියෙන්නෙ ඒ නිසයි. මම මේ මොහොතේ ප්‍රකාශ කරනවා දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ගැන අත්පොත් තබලා වත් නැති කාලෙක සභාව අඩුම තරමින් මේ සභා ලියවිලි ජනතාව අතරට වත් ගෙනිච්ච නැති කාලෙක ස්වාමි තාත්තා මේවා ඇතුළේ තිබුණු සාරය නිකන් හුදු දේවධාර්මික චින්තයෙක් හැටියට නොවෙයි සැබෑම ධ්‍යානපර ජීවිතයක්

ගත කළ ශුද්ධවන්තයෙක් හැටියට නොබියව සමිඳාණන් වහන්සේගේ රාජ්‍යය වෙනුවෙන් පෙනී සිටිය දිවැසිවරයෙක් හැටියට මේ දැක්ම, දර්ශනය ගිහියන්ට පෙව්වා. ගිහියන්ව ඒක ඇතුළට කාවැද්දුවා.

ඒ නිසා අද වෙනකොට අපට සන්තෝස වෙන්න පුළුවන් සැබෑ ගිහි භූමිකාව මේ ලංකා පොළොව තුළ හරියටම ප්‍රකාශ කරන සභාවේදීය විශ්වසනීය ප්‍රකාශනය පුබුදුව බව, නිතැතින්ම අපි හැමෝගෙම මුවින් එය ප්‍රකාශ වෙන්නට ඕන ම යි කියා මම විශ්වාස කරනවා. අවසාන වශයෙන් මම ඉදිරි යුගයෙන් යුගයට, දිවෙන් දිව, දිව යා යුතු පුබුදු ගමන පිළිබඳව මගේ සිහිනය මා ප්‍රකාශ කරන්නට කැමතියි. පුබුදුවට අත්‍යවශ්‍යයෙන්ම සිටින්නට ඕනා කවුද? පුබුදුවට සිටින්නට ඕනෑ සැබෑ ලෙසම ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරුණු ගමනක් යන ගිහියෝ යි. ඒ අය ක්‍රිස්තු අනුගාමිකයෝ වන තරමටයි ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය තුළ කිමිදෙන තරමටයි ඒ පුබුදු ගමන ඉදිරියට යන්නේ. ඒ නිසා 1996 දී ස්වාමි තාත්තා ගිහියාගේ අතට දුන්නු මේ ශුද්ධාත්ම ව්‍යාපාරය පිබිදුණු ගිහියන්ගේ අතින් තව යුගයෙන් යුගයට මෙය දායාද කරමින් මතු පරපුරටත් ගමන් කරන්නට බලය, ශක්තිය, ධෛර්යය ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් වැගිරේවා! කියා මේ පනස් වසර සමරන මේ ස්වර්ණ ජයන්ති මොහොතේ ප්‍රාර්ථනා කර සිටිනවා.

ජේසු පිහිටයි !

## ස්වාමි තාත්තා පිළිබඳ කෙටි වාර්තා වැඩසටහනට හැඳින්වීම

කිතු දන පුබුදුව ට මෙතරම් වැදගත් ඇයි මේ ජුබිලි මංගල රාත්‍රිය මෙතරම් ගාම්භීර උත්කර්ෂයකින් පුබුදු ජනතාව අත්විඳින්නේ ඇයි ?

ඒ අන් කිසිවක් නිසා නොවේ දෙවැනි වතිකානු මන්ත්‍රණ සභාව තුළින් එවක සභා ශ්‍රේෂ්ඨයන්ගෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ කරන ලද ඉල්ලීම, එදා ශුද්ධාත්මයාණන්ගේ අනාවරණය ලැබිච්ච සභා ශ්‍රේෂ්ඨයන් මත පැවරුණු දූත මෙහෙවර, වගකීම මේ සිරිලක් දේශය තුළ පළමු කොට ඉටු කරන්නේ, එහි පෙරගමන්කරු වන්නේ කිතු දන පුබුදුව නිසයි. එදා මෙදා අතරතුර පනස් වසක ගමන් මඟ අභිමානය ඉදිරිපිට ඒ ආවර්ජනය ඉදිරිපිට අපි මේ ප්‍රශංසාවේ රාත්‍රියට පිවිසිලා තිබෙන්නේ.

ඒ නිසයි ඒ ගමනේදී අපට අමතක කරන්න බැහැ ඒ පෙරගමන්කරුවා, උන්වහන්සේ මාධ්‍යයක් කරගත්ත දිවැසිවරයා අන් කවරෙකුවත් නොවේ ගරු සිරි ඔස්කා අබයරත්න පියතුමා යි. නිසැකයෙන්ම උන්වහන්සේ එළඹීමට නියමිත දශක ගණනක ඉදිරිය උන්වහන්සේ දේශයට අනාවරණය කළා. ඒ නිසයි උන් වහන්සේ සැබෑ දිවැසිවරයෙක් බවට පත් වන්නේ. මේ ගමන තුළ මේ දිවැසිවරයාගේ පන්නරය ලබමින් පැමිණි අඩසියවසක ගමන්මගේ ආවර්ජනය අපට මෙතරම් ගාම්භීර ඒ නිසයි. සැබැවින්ම මේ පුණ්‍ය භූමිය තුළත් ශුද්ධාත්ම රාත්‍රිය තුළ ශ්‍රී ප්‍රශංසාරාමය තුළත් මේ උන්වහන්සේ අප සමග වැඩ සිටිනවා. උන්වහන්සේ මේ සියල්ල දකිනවා. හැබැයි ඒ කිසිවක් නොදැක්කා වගේ සිටිනවා. උන්වහන්සේ සියල්ල අසනවා. නමුත් කිසිවක් නෑසුනා සේ සිටිනවා. එයයි

මිහිපිට දිවැසිවරයෙකු ව සිටිමින් ලබන අත්දැකීම. ඉතින් ඉදිරි මිනිත්තු ස්වල්පය අපි වෙන් කරන්නේ අබ්බා පියාණන් වහන්සේ ස්වාමි තාත්තා හරහා මේ දේශය තුළ සිදුකළ ඒ මහත් පෙරලියේ මහා භූමිකාවෙන් බිඳකට යොමු වන්නටයි. මේ රූපරාමු හරහා ඒ දිවැසිවරයාව ඔබ මා දකින්නට යනවා. ඒ අනාගත වක්තෘවරයා ඒ පෙර ගමන්කරුවාණන්, ඒ ප්‍රාරම්භකයාණන් අපි දකින්නට යනවා. එපමණකුදු නොවේ සැබවින්ම අනාගත ශුද්ධවන්තයෙකු සමඟයි අප මේ ගමන් ගනිමින් සිටින්නේ. මේ නිමේශය ඒ රූප රාමුව සඳහායි...

## ස්වාමි තාත්තා පිළිබඳ කෙටි වාර්තා වැඩසටහන

ගරු සිරි ඔස්කා අබයරත්න පිය, අප ආදර ස්වාමි තාත්තා තම දූතික ගමනට මුල පුරමින් 1957 නවම් මස 02 දින පූජක වරම් ලැබීය. සිය පූජක දිවියේ ආරම්භයේ සිට ම දුප්පතා, දිළින්දා, අසරණයා, පීඩිතයා, තරුණයා, කම්කරුවා, වෙනුවෙන් පෙනී සිටීම එතුමාගේ ස්වභාවය විය. දූෂණය, අල්ලස, අසාධාරණයට එරෙහිව යථාර්තවාදීව කතා කරන, සත්‍යයට සාක්ෂි දරන්නෙක් ලෙස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ එතුමාණන්ගේ දැක්ම විප්ලවීය ස්වරූපයකින් ඉස්මතු කරලීය. එතෙක් පැවති බැතිබර ගතානුගතික ආගමික ප්‍රතිරූප කඩා දමන්නෙක් විය.

1971 දී උත්ථාන වූ කිතු සමිඳාණන් ගෙන් ලද ස්පර්ශය ශුද්ධාත්ම පිබිදීමේ අත්දැකීම, එතුමාණන්ගේ ජීවිත ගමනේ හැරවුම් ලක්ෂ්‍යය සනිටුහන් කරන්නට විය. තමන් විඳි එකී අනර්ඝ අත්දැකීම් තමන් සමඟ සිටි තරුණ තරුණියන් හා බෙදා ගනිමින් වෙනස් වූ යාච්ඤාවේ හා ප්‍රශංසාවේ ගමනකට පියතුමන් පිවිසියේ ය. එකල සාමාන්‍ය කතෝලික ගිහි ජනතාවට අකැප යැ”යි සම්මතව තිබූ ශුද්ධ බයිබලය තරුණ

සුරතට නතු කරමින්, දේව වචනය තුළ දේව පොරොන්දු අයිති කර ගනිමින්, දේව කැමැත්ත ඉටු කරනු වස් අප පියතුමන් වටා තරුණ තරුණියෝ රොද බඳින්නට වන. ඒ එතුමන් සතු වූ චතුර වාග් කථිකත්වයට වඩා, ඒ වචන තුළින් යොවුන් ආත්මයට ම ආමන්ත්‍රණය කළ ශුද්ධාත්ම ස්ප්‍රිතුවේ ජ්වලිත උසිගැන්වීම නිසාවෙනි.

එවකට මූලධර්මවාදීන් විසින් විකෘති පරිශීලකයක් ලෙස සිය ග්‍රහණයේ පැවැති ශුද්ධ බයිබලයේ සැබෑ දේව අනාවරණයන් සොයා යමින් ශුද්ධවූ සභාවේ ජීවමාන සම්ප්‍රදායේ ජීවන රසය ජන හද තුළට මුදා හරින්නට ශුද්ධාත්මයාණන් වහන්සේ ම එතැන් පටන් එතුමාව මෙහෙය වූයේ සසුන් කෙත සුරකින ශුද්ධාත්ම පවුරකට අඩිතාලම සපයමිනි. තවද ප්‍රඥාව පතා වරම් අයදිමින් කරන යැදුමක දී හෝ ජනවන්දනා චක්‍රයේ පෙන්තකොස්ත මංගල්‍යදාට පමණක් ලඝු කොට පැවති ස්ප්‍රිතු සාන්තු වහන්සේ සමඟ මුළු දිවිය පුරා බද්ධ වෙමින් ශුද්ධාත්ම මෙහෙයවීම තුළ නිරන්තර ශුද්ධාත්ම අවදිවීමට පිබිදුණු කිතුනු දන හට පෙර මං තනා දුන් පුරෝගාමියා වන්නේ ද අප ආදර ස්වාමි තාත්තා ය.

එතුමන් සිය බස් වහර මුහු කළේ දේශීය සංස්කෘතිය හා බැඳි ආධ්‍යාත්මික හරයන් සමඟ බද්ධ වෙමිනි. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, වැනි මෙරට ප්‍රධාන ආගමික රාමුව අතික්‍රමණය කරමින් ඒ සියලු දහමකම ආධ්‍යාත්මික තලය හෙවත් ධර්මය ස්පර්ෂ කළ එතුමෝ "හැම ආගමක්ම එකයි" වැනි සිල්ලර බාල විවරණයන්ගෙන් මිදී ඒ සෑම දහමකට ම අනන්‍ය වූ ධාර්මික ගැඹුර පිබිදුණු දන වෙත සමීප කරවා ලී ය.

ශුද්ධවූ සභා ඉගැන්වීම් මත පිහිටා ස්වාමි තාත්තා විසින් ඉදිරිපත් කළ විවරණයන් සැමවිට ම, සැමහට ම, ඒකාකාරව ලයාන්විත නොවී ය. ශුද්ධවූ දේව අනාවරණයේ බෙදා

ගැනීම් විටෙක සෘජු මෙන්ම රළු විය. එය විටෙක සාමාන්‍ය කිතුනු ජනතාවට මෙන්ම ඇතැම් සභා ශ්‍රේෂ්ඨයන්ගේ කිතුනු දැක්ම හා ආකල්ප අතර පරස්පරතා තීව්‍ර කරලන්නක් ද විය. නමුත් ශුද්ධාත්ම අනාවරණයන් ඉදිරිපිට මුනිවත රැකීමට හෝ කිසිවකුගේ මනදොල පිනවීමට හෝ පක්ෂපාතී බව ලබා ගැනීම පිණිස එතුමන් කිසිවිටෙක දේවධර්ම විග්‍රහයන් පටලවා නොගත්තේ ය. දේවමාතාවන් සේම, ක්‍රිස්තුස් වහන්සේ අරභයා ගැඹුරු දේව ධර්මයක් එතුමන් හරහා ලක් ශුද්ධවූ සභා මාතාව වෙත දායාද වූයේ දේවාත්මානුභාවයට අසීමාන්තිකව විවෘත වීමේ මා හැඟි නිධානයක් පරිද්දෙනි. එනිසාම දේවමාතාවන් විෂයෙහි දක්වන භක්ති අභ්‍යාසයන් අතික්‍රමණය කොට එතුමියගේ හදවත විනිවිද දකිමින් දේව අභිමතය සපළ කරවාලන ජනතාවක් තනන්නට අබ්බා පියාණන් ස්වාමි තාත්තාව මාධ්‍යයක් කොට ගත් සේක.

අප ආදර ස්වාමි තාත්තාගේ ජීවන වපසැරිය සාම්ප්‍රදායික පූජක චරිතයෙන් ව්‍යුක්ත වන්නේ එතුමන්ගේ දර්ශනය හුදු ආධ්‍යාත්මික රාමුවකට පමණක් ලඝු නොවූ නිසාම ය. උත්ථාන වූ කිතු සමිඳාණන් සිය එකම සමිඳාණන් ලෙස දිවි හිමියෙන් භාරගැනීමේ අත්‍යන්ත ප්‍රතිඵලය වූයේ නිතරම එතුමන් ක්‍රිස්තු හදවතට ගමන් කරලීම ය. එනිසාවෙන්ම සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, පාරිසරික හෝ ගෝලීය මොනයම් සන්දර්භයක ට අයත් වූ ස්ථරයක් වෙත වුව ද කිතුනු ලීලාවෙන් අතපෙවීමට එතුමෝ පසුබට නොවූහ. ඉරණවිල ඇමරිකන් හඬ, එප්පාවල පොස්ෆේට් නිධිය, නොරොච්චෝල තාප බලාගාරය වැනි ජාතික සංවර්ධන ව්‍යාපෘති වලට මුවාවෙමින් සිදුවන්නට ගිය මහත් වූ පරිසර ව්‍යසනයන් මෙන්ම සමාජ විකෘතිතාවයන් නිවැරදි කිරීමට එතුමන් හට පන්නරයක් වන්නේ ද එකී ක්‍රිස්තු අත්දැකීම ය.

තවද දශක කිහිපයක ඔබ්බෙහි වූ අනාගතය සඳහා වත්මන් පිබිදුණු ජනතාව සූදානම් කිරීමේ සුවිශේෂී වූ නායකත්වයක් ද එතුමන් සතු විය. තාක්ෂණික විපරිතයන්, පරිසර විපර්යාසයන්, දේශපාලන පෙරළින් මෙන්ම සමාජ දෝලනයන් හමුවේ පූර්ව අනාගත වක්තෘවරයෙකු මෙන් ඒ සියල්ල හමුවේ ගිහි ජනතාව පෙළගස්වාලමින් හුදු දේශනාවාදියකු නොවී සැබෑ පෙර ගමන් කරුවකු වන්නට එතුමන් සමත් වන්නේ ද ආත්මයාණන් වහන්සේගේ රිද්මයට නතු වීමේ ප්‍රතිඵලයක් නිසාම විය යුතු ය.

ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය, ලිබරල්වාදය, වැනි වාදයන් හෝ පුද්ගල මතවාදයන් සමඟ පැටලෙනු වෙනුවට ධර්මය හරය කරගත් ඒකීය රටක් තුළ දිළින්දාව ඔසවාලන ව්‍යවස්ථාවක් පිළිබඳව ස්වාමි තාත්තා සිය පන්හිඳෙන් ජාතික මාධ්‍යයන් ඔස්සේ ද ජනතාව අවදි කරවා ලීය. එකී නව දේශපාලන චින්තන දහරාව පසු කලෙක දිවැසි ප්‍රතිරාව නමින් වියත් හදවත් තුළ රාව ප්‍රතිරාව නංවමින් තිබේ. දිළින්දා තවත් දිළිඳු කරවන ආර්ථික සංවර්ධනයේ නිශ්ඵල බව දුටු ස්වාමි තාත්තා හුදු කතා කරුවෙකු නොවී ඊට ජීවමාන ජීවිත සාක්ෂියක් වෙමින් සැබෑ සරළ අල්පේච්ඡ ජීවිතයේ නිදහස් නිවහල් අමන්දානන්දයට පාර කියන කැඩපතක් ම විය.

එනයින් ගත්කල ස්වාමි තාත්තා හරහා ශුද්ධාත්මයාණන් වහන්සේ පිබිද වූයේ ලක් කිතු සස්න පමණකුදු නොව සමස්ථ දේශයේ සියලු පැතිකඩයන්, පාර්ශවයන් වෙත ඒ ශුද්ධාත්මාලෝකයේ සුදීප්ත ධාරාව සිසාරා ගලා ආවේ ය. විටෙක එතුමන් ඉදිරිපත් කළ ගැඹුරු අධ්‍යාත්මික විවරණයන් පුබුදු ජනතාවට පවා ගෝචර නොවූ බවද ඉඳුරාම පැවසිය යුතු ය. එතරම්ම ඒ අනාවරණයන් තුළ වූ ශුද්ධභාවයේ ස්වර්ගීය තනුව පහදා විග්‍රහ කළ නොහැකි තරම් විය. 1996දී

කිතු දන පුබුදුව සිය විසිපස්වන ජුබිලියෙන් පසු අත්හැරීමේ අත්දැකීමට පූර්ණ නිදහසකින් යුතුව ස්වාමි තාත්තා පිළිතුරු දුන්නේ එතැන් පටන් අත්විඳිය යුතු ස්වර්ගීය අනාවරණයන් සම්භාරයක් එතුමන් අබිමුව වූ බැවිනි. එනිසාම මතුගම කඳු මුදුනේ වන හමුවේ දී අත්පත් කරගත් එකී ස්වර්ගීය රසරහස් මිහිමත සිය ළබැඳි දූ දරුවන් හා බෙදා ගනු පිණිස "රාජ්‍ය සඳහා පුතෙකුට පුතෙක්" නමින් දියත් කෙරුණු එකී ගැඹුරු ධ්‍යානපර යාච්ඤාව පුබුදු ජනතාව විසින් ගමන් කළ යුතු වන ඉදිරි මඟ වෙත නාභිගත කරවන ශුද්ධාත්මාලෝකයේ ප්‍රදීපාගාරයක් බඳු විය.

ආදර තාත්තේ ඔබ අද අප අතර නිහඬ ය. නිසංසල ය. මිහිමත සිට ස්වර්ගීය සේනාවන්ගේ ප්‍රතිරාව අත්විඳින දිවැසිවරයෙකු පරිද්දෙන් ඔබ අපගේ ප්‍රපංචේන්ද්‍රිය මානයේ සිට සුරලොව - මනුලොව හා යා කරමින් සිටි යි. තාත්තේ ඔබ හරහා දෙවි මහෝත්තමයාණන් ලක් ශුද්ධවූ සභා කෙතෙහි රෝපණය කළ ශුද්ධාත්ම පෙරළියේ බීජය අංකුරයක් ව වැඩී දළු ලා සතර දිග් භාගයේ අතුපතර විහිදා අද නැගී සිටින්නේ දැවැන්ත මහා වෘක්ෂයක් පරිද්දෙනි.

එහි සෙවන ලබන අඩ සියවසක් පුරා ශුද්ධාත්ම ගමනේ මඟ අසා දැන අත්විඳි පිබිදුණු ජනතාවෝ අද සංකර, විඩාබර ජීවිත ගමනෙන් මිදී සැබෑ අධ්‍යාත්මික විශ්‍රාමයේ සුව පහස විඳ ගනිමින් සිටිති.

මහෝත්තම අබ්බා පියාණෙනි,

ඔබ වහන්සේට මෙතරම් විවෘත වූ පූජක පුතෙකු, පෙරගමන්කරුවකු, දයාබර පියෙකු සමඟ පුරා පනස් වසක දිවැසිවර පහස ලබන්නට දුබල අපව ද භාග්‍යවත් කිරීම උදෙසා තුති පැසසුම් වේ.

## තේමා දේශනයට ආරාධනය

කෙමෙන් කෙමෙන් අප සපැමිණෙමින් සිටින්නේ ගාම්භීර ජුබිලි මංගල රාත්‍රියේ උච්චතම අවස්ථාවට යි. ශුද්ධවූ සභා මාතාවට දේව වචනය පෙරටු කරගත් වසරක ගමනක් යන්නට, තේමාවක් සමගින් වසරක, ගමනක් යන්නට මං තනා දුන්නේ කිතු දන පුබුදුව. මුළු වර්ෂයක් පුරා ජනතාවක් ජීවත් වන හැටි, දේව වචනය ජීවත් කරවන හැටි අපට කියා දුන්නේ කිතු දන පුබුදුව. ඒ ගමන් මගේ පනස්වන රාත්‍රිය යි මේ උදා වෙමින් තිබෙන්නේ. මේ මොහොත මංගල රාත්‍රියේ, මේ වර්ෂයේ අපගේ තේමා දේශනය සඳහා පිවිසෙන්නට යි අපගේ මේ සූදානම.

ඒ සඳහා අප අතරට පැමිණ තිබෙනවා කිතු දන පුබුදු ජාතික දිවැසි එකතුවේ රන්ජනා කවිරත්න අම්මා. ඉතින් අපි මේ මොහොතේ ආත්මයාණන් වහන්සේට ඉඩ දෙමු අපව මෙහෙය වන්නට කියලා. ඇගේ මුවින් නික්මෙන මේ ජුබිලි වර්ෂයේ තේමා දේශනය උන්වහන්සේගේම වචන බවට පත්වෙමින් අපගේ හදවත තුළ ඵල දරන්නට, පැළ වෙන්නට, ඉදිරි වර්ෂය පුරා පමණක් නෙවෙයි තවත් අඩ සියවස් ගණනාවක් පුරා උන්වහන්සේ සමිදාණන් හැටියට බාර ගනිමින් මේ දේශය ඒකාලෝක කරන්නට උන්වහන්සේගේ වචනය අප හමුවේ තබන අම්මා වෙනුවෙන්, අප සියලු දෙනා වෙනුවෙන් අපි දැන් හදවතින් යාච්ඤා කරමු. අපි ශුද්ධාත්මයාණන් වහන්සේට ආරාධනා කරන්නට යනවා අප අතර, අප තුළ සැරිසරන්නට කියලා. මේ මොහොතේ නිවෙස්වල, දේවස්ථානවල, පිරිස් රොද බැඳගෙන මේ වචනයට දැහැන් ගත වන්නට, ඒ වචනය ආත්මගත කරගන්නට සැරසෙන මොහෙතේ අපි විශේෂ ආකාරයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට ශුද්ධාත්ම ගීතිකාවකින් ආරාධනා

කරමු. ලොකු විශ්වාසයකින්, ලොකු ආදරයකින්, ලොකු ගෞරවයකින් අපව වසා ගන්නට කියලා. ආත්මයාණන් වහන්සේගේ වැඩම කිරීමට අපව නතු කරගන්නට කියලා. අපගේ ඇට ලේ මස් නහර පුරා උන්වහන්සේගේ ඒ ජීවමාන රුධිරය රැගෙන යන්නට කියලා අපි ඔවුන් වහන්සේට ආරාධනා කරමු.

## රන්ජනා අම්මාගේ දේශනය (ජුබිලි වසර සඳහා තේමා දේශනය)

"ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය" 1971 ශුද්ධාත්මයාණන් වහන්සේ විසින්ම ආරම්භ කලාවූ කිතු දන පුබුදුව 50 වසරක ගමනක් ගත කරලා අද අපි අපගේ ස්වර්ණ ජයන්තිය සමරණවා. අද අපිට ඉතාමත් ප්‍රීතිමත් දවසක්. එය ගාම්භීර දවසක්. එය ආනන්ද ජනක දවසක්.

බැලූ බැල්මට අපට පේන්නේ අප වටකර පුදුමාකාර අන්ධකාරයක් වාගේ. දේශපාලන භූමිය දෙස බැලුවත්, ඒ වගේම මේ රටේ කොරෝනා තත්ත්වය මුල් කරගෙන දැන් වෙනකොට විශාල සංඛ්‍යාවක් අපගේ දයාබර රට වැසියන් මරණයට පත් වෙලා . විශාල ජනතාවක් බියෙන් පසු වෙනවා. වෛද්‍යවරුන් කොහොමද අපි මේකට පිළිතුරු දෙන්නේ කියන ප්‍රශ්ණය ඒ අයට තියෙනවා. ඒ වගේම අවුරුදු දෙකකට කලින් පාස්කු ඉරිදා සිදුවුනාවූ ඒ බේදවාචකයට අද වෙනතුරුත් නිසි පිළිතුරක් නොමැතිව අපේ ජනතාව ඉතාමත් අසරණ අත්දැකීමක ඉන්නවා.

ඒ අතරම කිතු දන පුබුදුව හැටියට අපත් අවුරුදු දෙකක් පුරා ඉතාමත් වේදනාත්මක අත්දැකීම් රාශියක් පසුකර ගෙන ආවා. මේ යාච්ඤාවට සූදානම් වෙද්දී ස්වාමින් වහන්සේ

මට උන්වහන්සේගේ පුදුමාකාර අලංකාර වූ පොරොන්දුවක් මතක් කරලා දුන්නා. පුබුදුවේ ඉන්න අප කාටත් හුරුපුරුදු, පුබුදුවේ ඉන්න අපි කවුරුත් ආදරය කරන රෝම 8:28 " දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට ඔවුන් වහන්සේ සියල්ල යහපතට හරවන සේක." ඒ නිසා මා සඳහන් කළාවූ සියළු කාරණා අතුරෙන් අප යන්නාවූ මේ අපහසු, අමාරු, වේදනාත්මක අත්දකීම පවා අපගේ දෙව් පියාණන් වහන්සේ ප්‍රේමයේ පියාණන් වහන්සේ ඒ සියල්ල යහපතට හරවන බව මට නම් ස්ථිරයි.

ඒ නිසා ඇයි අප ප්‍රශංසා කළ යුතු නැත්තේ? ඇයි අද ආනන්ද දවසක් නොවිය යුත්තේ? ඒ නිසා අද දවස පැහැදිලිවම අපගේ ස්වර්ණ ජයන්තිය පවත්වන මේ දවස අපට සුවිශේෂ වූ දවසක්. මට හිතෙනවා කිතු දන පුබුදුව කියන ඒ පොතේ අද දවසේදී අලුත්ම අලුත් පරිච්ඡේදයක් ආරම්භ කරනවා කියලා. ඒ පරිච්ඡේදයෙත් ආරම්භකයාණෝ ශුද්ධාත්මයාණන් වහන්සේමයි. ඒ නිසා අපට ඉමහත් ප්‍රීතියක් අත්දකින්නට පුලුවන් කාලපරිච්ඡේදයකට සියළු ප්‍රශ්න බාධක මැද අපි නිර්භයව, නිර්භීතව දෙවියන් වහන්සේගේ දරු කැළක් හැටියට අපි සියල්ලට මුහුණ දෙන්නට යනවා.

අපි අවුරුදු හතරකට පෙර සූදානම් වීමේ යාච්ඤාවේදී තමයි අපගේ දෙව් පියාණන් වහන්සේ අපගේ මේ ස්වර්ණ ජයන්තිය සමරණ වසරට තේමාව "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ" කියන වචනය තෑගි කළේ. අපි ඉමහත් ප්‍රීතියෙන් ඒ වචනය භාර ගත්තා. ඒ අවස්ථාවේ මට තාමත් මතකයි උන්වහන්සේගේ මගපෙන්වීම, සමිඳාණන් වහන්සේ අපට කිව්වා, ඔබ පුබුදු ජනතාවක් හැටියට ඔබගේ ආරම්භයට යන්න කියලා. එහෙම නම් කිතු දන පුබුදුව ආරම්භ කළ 1971 වසර, අපි එතැනට ගමන් කළොත් මේ ජුබිලි වසර

අපට තවත් අර්ථවත්ව ගත කරන්න පුලුවන්. කෙසේද අපගේ ආරම්භය සිද්ධ වුනේ? ඒ ආරම්භයත් මේ ජුබිලි වසරේ මේ පැයේ වාගේම ඉතාමත් වේදනාත්මක දුක් මැද තමයි පුබුදුව නමැති දරුවා මේ ලෝකයට බිහි වුනේ. එහෙමත් නැත්නම් දෙවියන් වහන්සේ බිහි කළේ.

ස්වාමි තාත්තාගේ ආත්මයෙහි, උන්වහන්සේගේ හදවතෙහි, එහෙමත් නැත්නම් උන්වහන්සේගේ ගර්භයෙහි පුබුදුව කියන මේ බීජය රෝපණය වුනු වෙලාවේ, දැන් එබෝෂන් කරනවානේ, දරුවව කුසයට ආපු ගමන. ඒ වගේ මේ දරුවව එබෝඩ් කරන්න, එහෙම නැත්නම් ඒ දරුවව නැති කරන්න යක්ෂයා, ලෝකයා, මාංශයා යන තුන්දෙනාම බලවත් සටනක යෙදී සිටියා. ඒත් එහි ආරම්භකයාණෝ ශුද්ධාත්මයාණන් වහන්සේ නිසා යක්ෂයාටවත්, ලෝකයාටවත්, මාංශයාටවත් තාත්තාගේ ආත්මය තුළ, ගර්භය තුළ පිළිසිඳුනාවූ මේ දේව වචනය නමැති මේ පුදුමාකාර බීජය මරන්නට බැරුව ගියා. මේ දරුවා ඉතාමත් අලංකාර දරුවෙක් හැටියට මේ දරුවාව දෙවියන් වහන්සේ බිහි කළා. මේ දරුවාට උපත දුන්නා.

මේ දරුවාව මරන්න හැදුවේ ඇයි කියන ප්‍රශ්ණය දෙස අපි බැලුවොත්, ඒක අපට එතරම් විශ්මය ජනක ප්‍රශ්ණයකුත් නෙමේ. ඇයි ශුද්ධාත්මයාණන් වහන්සේ මුළු පොළෝ තලයේම උන්වහන්සේගේ මේ ක්‍රියාවලිය කරගෙන යද්දී බොහෝ අයට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාවලිය වටහා ගන්නට, තේරුම් ගන්නට බැරුව ගියා. ඒ නිසා අපේ ලංකාවේ පමණක් නොවෙයි මුළු ලෝකය පුරාම පිබිදීම කියන මේ දරුවාව බාර ගන්නට බැරි තත්ත්වයක්.

එක්තරා විධියට පුදුමයකුත් නෙමේ, මට මතක් වෙනවා XXIII වන ජුවාම් පාප් වහන්සේ ඒ කාලයේ සභාව නිකන් මළ සභාවක් වාගේ. ප්‍රාණවත් නැහැ, උන්වහන්සේට හරි දුකයි.

මේ සභාව මැරිලානේ, උන්වහන්සේ කියුරියාව කැඳෙව්වා. ඒ එකතුවට කාදිනල් තුමන්ලා මට මතක හැටියට 20ක් ද කෙහෙද සම්බන්ධ වෙලා හිටියා. පාප් වහන්සේ ඔවුන්ව ආමන්ත්‍රණය කරලා කියනවා, අපි II වන වතිකාන මන්ත්‍රණ සභාව කැඳවමු නේද? ආරම්භ කරමු නේද? බලන්න සභාව මැරිලා වගේ. සභාව ආරම්භයට ගමන් කළ යුතුයි නේද? බලන්න ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වයක් නැහැ නේද? මළානික වෙලා නේද? පාප් වහන්සේගේ ලියකියවිල්ලක උන්වහන්සේම කියනවා, ඇල්පෙනෙත්තක් බිමට වැටෙන තරම් ගැඹුරු නිශ්ශබ්දතාවයක් තිබ්බා. උන්වහන්සේ බලන් ඉන්නවා මේ කාදිනල් වහන්සේලා උන්වහන්සේ ළඟට ඇවිල්ලා අත්පුඩි ගහයි, ප්‍රශංසා වේවා කියලා කෑගහයි, උන්වහන්සේව ඉඹ ගනියි, පාප් වහන්සේ කියනවා මා ඒ වගේ හිතුවා, ඇයි ඔබ ඔක්කොමල්ලා මූණ දික්කරන් ඉන්නේ? ඇයි ඔබ ඔක්කොමල්ලා බිම බලන් ඉන්නේ? ඇයි ඔබ එක්කෙනෙකුටවත් හිනාවක් යන්නෙ නැත්තේ? මට දැන් වෙහෙසයි, මට තවත් මෙතන ඉඳගෙන ඉන්න බැහැ, ඒ නිසා මම දැන් මෙතනින් නැඟිටලා යනවා කියලා XXIII වන ජුවාම් පාප් වහන්සේ ඒ ස්ථානයෙන් නැඟිටලා ගියා. මේ වතිකානයේ ලිපිවල තියෙන කථාන්දරය සත්‍ය පුවතයි.

ඉන් පස්සේ පාප් වහන්සේ යාච්ඤාවට ගියා. යාච්ඤාවට ගිය උන්වහන්සේට මේ පිබිදීම ඇති වෙනකන් ඉවසිල්ලක් නැහැ. උන්වහන්සේට ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය සභාව ආරම්භක පෙන්තකෝස්ත දිනයේ සිදුවුනාවූ ඒ සිද්ධිය දකින්නට උන්වහන්සේ පුදුමාකාර සිහිනයක් මැව්වා. උන්වහන්සේ යාච්ඤා කරලා කරලා, උන්වහන්සේ ජනතාව අතරට එන දවසක එහි සඳහන් වෙනවා ලක්ෂ පහක පමණ ජනතාවක් පේදුරු තුමාගේ චතුරශ්‍රයේ ඒ මහා වතිකානයේ එළියේ රැස්වෙලා හිටියා. උන්වහන්සේ ජනේලයෙන් බලලා

කියනවා, මට ඕනේ සභාව අර ආරම්භක තැනට ගිහිල්ලා විශාල පිබිදීමක් දකින්නටයි. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වයක් දකින්නටයි. මට II වන වතිකාන මන්ත්‍රණ සභාව කැඳවන්නට ඕනෙයි කියලා. මිනිස්සු මොර හඬ දීලා ප්‍රශංසා කළා. එක දිගට ඒගොල්ලෝ අත්පොලසක් දුන්නා. පාප් වහන්සේ ඒ වචනය, ජනතාවගේ ඒ ප්‍රතිචාරය දෙවියන් වහන්සේගේ කැමැත්ත හැටියට බාර අරගෙන II වන වතිකාන මන්ත්‍රණ සභාව කැඳෙව්වා. එයට සූදානමක් හැටියට උන්වහන්සේ ශ්‍රේෂ්ඨයන්ට කථා කරලා කිව්වා ඒ ලියකියවිලි සකස් කරන්න කියලා. උන්වහන්සේ ළඟට ගෙනාවූ ඒ ලියකියවිලිවල ශුද්ධාත්මයාණන් වහන්සේ කියන නම, ශුද්ධාත්මයාණන් වහන්සේව එක වාරයක්වත් සඳහන් වෙලා තිබුනේ නැහැ. පාප් වහන්සේ විශ්මිත වුණා. උන්වහන්සේගේ විශ්මය ප්‍රකාශ කළා. උන්වහන්සේ කිව්වා, මේ මොනවද මේ? ශුද්ධාත්මයාණන් වහන්සේව නැතිව කොහොමද අපි ඒ පෙන්තකොස්තය, කොහොමද අපි සේනාකුළු ශාලාවට ගමන් කරන්නේ? සභාවේ ආරම්භක දවසට කොහොමද අපි යන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ නැතිව. මේක වැඩක් නැහැ, නැවත ලියන්න කියලා ආපහු දුන්නා. දෙවනුව සකස් කළාවූ ඒ ලියකියවිල්ලේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාවලිය විශාල වාර ගාණක් සඳහන් වෙලා තිබුණා.

ප්‍රේමවන්තයිනි, එවැනි යුගයක කිතු දන පුබුදුව ශ්‍රී ලංකාවේ ආරම්භ වෙලා තියෙද්දී මේක තේරුම් ගැනීමට නොහැකි වීම පුදුමයක් නොවෙයි. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ මේ දරුවාට අත තියන්නට කාටවත් ඉඩ දුන්නේ නැහැ. කුමාරයෙක් වාගේ පුතෙක් උපන්නා 1971. ඌට දැන් අවුරුදු 50යි. ඌ දැන් උස මහත් වෙලා. ඌ සමහර වෙලාවට චණ්ඩිකමුත් කරනවා. ඒත් කීකරු වෙනවා තරවටු කරද්දී. මේ පුදුමාකාර පුත්‍රයාව විනාශ කරන්නට අත තබන්නට

සර්වබලධාරී දෙවියන් වහන්සේ කාටවත් ඉඩ හරින්නේ නැහැ කියලා මේ ස්වර්ණ ජයන්තිය දවසේදී මා ප්‍රකාශ කරන්න කැමතියි.

කිතු දන පුබදුව මේ ලෝකයේ කිසිම මනුෂ්‍යයෙකුට විනාශ කරන්නට බැහැ. දයාබර දරුවෙනි, මගේ ඇතුලෙ වෙන මේ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය මිනිහෙක්ට ඇවිල්ලා ඇදලා ගන්න පුලුවන්ද? මොන පිස්සුද? ඔබගේ ඇතුලේ ඉන්න මේ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය මිනිසෙකුට ඇදලා විසි කරන්න පුලුවන් ද? බැහැ. ඒ නිසා මා ඔබට කියනවා ස්වාමින් වහන්සේගේ බලයෙන් අද දවසේදී සන්නද්ධ වෙන්න කියලා. "ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබුණු කල නුඹලා බලය ලබන සේක." මොනවටද බලය ලබන්නේ? පේනවානේ අපේ දේශපාලඥයෝ කරන දේවල්. අනිත් උන්ගේ දේවල් හොරකම් කරන්නටද? අනිත් උන්ට අසාධාරණම් කරන්නටද බලය? තමන්ගේ ආත්මාර්ථකාමී දේවල් කරගන්නටද බලය? නැහැ, එය දිව්‍යමය බලයක්. ඒ බලය එක දේකටයි දීලා තියෙන්නේ. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ කියා නිර්භයව ඕනේ තැනක ප්‍රකාශ කරන්නටයි. ඒ නිසා මම හැම වෙලේම කියනවා මගේ නාස් පුඩුවේ හුස්ම තිබෙනතාක් කල් මම සැමදාම කියනවා, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගේ ජීවිතයේ සමිඳාණෝ කියලා. ස්වාමියාණෝ කියලා. ඒක කාටවත් ගන්න බැහැ. ඒක කාටවත් තුවාල කරන්න බැහැ.

ඒක නිසා මා පුබුදු ජනතාවගෙන් අති මහත් වූ පුබුදු ජනතාවගෙන්, ලෝකයේ දස දෙස විහිදී ඉන්න පුබුදු ජනතාවගෙන් අද මා ඉල්ලනවා, අද අපගේ ස්වර්ණ ජයන්තිය දවසේදී ඔබ ආරම්භයේදී පටන් ගත්තාවූ ඒ අත්දැකීම "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය" කියන එක කවදාවත් කාටවත් කියන පලියට ඉල්ලන නිසා පාවා දෙන්නට එපා.

අපිට තව රජෙක් නැහැ. අපට තව ස්වාමියෙක් නැහැ. අපිට තියෙන්නේ එකම එක ඔටුන්නයි, ජේසුගේ ඔටුන්න විතරයි. උන්වහන්සේ රජුන්ගේ රජාණෝයි. ස්වාමිවරුන්ගෙත් ස්වාමියාණෝ. උන්වහන්සේ එකම එක ස්වාමියාණෝයි. එකම එක ගැළවුම්කරුවාණෝයි.

ප්‍රේමවන්තයිනි, ගෝළයෝ ජේසුව අල්ලනවා, ජේසුව ඉඹිනවා. මම දන්නෙ නැහැ පේදුරු ගෝළයා ඉම්ඹද කියලා. ජුවාම් ගෝළයා ඉඹින්න ඇති. එකට එකතු වෙලා කෙහෙල් ගෙඩියක් කන්න ඇති, කිරිබත් කෑල්ලක් කන්න ඇති. රොටියක්, හොඳ මාළු කුරියෙක් බැදලා හොද්දක් එක්ක එකට කන්න ඇති. ඒගොල්ලෝ මේ ජේසු කරන පුදුම හාස්කම් ඔක්කොම දැක්කා. ලාසරස්ව මරණයෙන් නැඟිට්ටවන කොට හිටියා. අන්ධයන්ට පෙනීම දෙන කොට හිටියා. ඒ වුනාට ඒ අය "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය" කිව්වේ සේනාකුළු ශාලාවේදී ඒ ඔවුන් ලැබූවාවූ ඒ මහා අත්දැකීමෙන් පස්සෙයි. ඒ වෙනකොටත් ඒගොල්ලෝ එක එක්කෙනාට බයයිනේ. පිලාත්ට බයයි. අර පේදුරු ජේසුව ගෙනියන කොට නඩු තීන්දුවට මිනිහා ගේට්ටුවෙන් එළියට එන්නේ නැහැ. බයේ වෙවුලනවා සට සට ගාලා. මේ ජේසුව අල්ලලා, ඉඹලා දැක්කා ඔක්කොම. ඒ වුනත් බය ගුල්ලෝ වාගේ හැසිරුනා. කුරුසේ පාමුල ඒ අය නැහැ. බලන්න ඒගොල්ලන්ට ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබුනට පස්සේ ඒ බය නැති වෙලා ගියා. ජේසුව බාර ගන්න තියෙන සෑම බයක්ම නැති වෙලා ගියා. මරෙන්නත් බය වුනේ නැහැ.

මට මතක් වෙනවා මගේ අත්දැකීමක්. මම ඔබ සමඟ නිතරම කියලා තියෙනවා. මට ඩෙංගු හැදිලා ඉස්පිරිතාලේ ගිහිල්ලා දොස්තර මාව බලලා කිව්වා, දැන් ඔයාව දැඩි සත්කාර

ඒකකයට දාන්න ඕනේ, ඔයාගේ ලේ ප්‍රමාණය සාමාන්‍ය ප්‍රමාණයට වඩා දස ගුණයකින් අඩු වෙලා. දවස් දෙකක් දැඩි සත්කාර ඒකකයේ ඉන්න කොට ඒ දොස්තර මාව බලලා කිව්වා, මිසිස් කවිරත්න මම ඔයාව දැකලා නැහැ, ඔයාගේ මූණ මේ වගේ හැම තිස්සෙම රතු පාටද කියලා ඇහැව්වා. මම කිව්වා, ඩොක්ට මගේ මූණ මට පේන්නෙ නැහැ රතු ද කොහොම ද කියලා. බලන්න මගේ අත් දෙක. මේක නම් මගේ අත් දෙකේ පාට නෙමේ කියලා මම පෙන්නුවා. ඒ දොස්තර කිව්වා, දැන් තමයි ඔයාට සනීප වෙන මොහොත කියලා ගියා. මම දැන ගත්තා එයා කියන්න හදන්නේ දැන් තමයි මෙයා මැරෙන මොහොත කියලා. ඊට පස්සෙ මාව බලන දොස්තර ආවා. එයා මාව බලල, දැඩි සත්කාර ඒකකයේ දොර රෙදි අස්සෙන් කියන ඒවා මට ඇහෙනවා කියලා ඒ දොස්තරට අමතක වෙන්න ඇති. එයා මාව බලන්න ඉන්න නර්ස්ට කථා කරලා කිව්වා, මීට වඩා ප්‍රෙෂර් එක චුට්ටක් හරි වෙනස් වුනොත් මට කෝල් එකක් දෙන්න කිව්වා ජංගම දුරකථනයට.

මම හොඳට හාන්සි වුණා. දොස්තරලා දෙන්නෙක්ම කිව්වා, මෙයා මැරෙන වෙලාව කියලා. මටත් ඇඟ රිදෙනවා, වමනෙ යනවා, උණ හොඳටම. මම ස්වාමින් වහන්සේට කිව්වා, ස්වාමිනී මට එකක් ස්ථිරයි. මේක නම් මගේ අවසාන පැය ඔබවහන්සේ මට ස්වර්ගයෙන් බිඳක් පෙන්වනවා කියලා මම හොඳට අර මැරිච්ච මිනිස්සු ඉන්නවා වගේ ඇස් දෙක වහගෙන හිටියා. හිටියා - හිටියා - හිටියා මට ස්වර්ගයෙන් බිඳක් පෙනුනේ නැහැ. මම ඉඳ ගත්තා, මම දන්නවා මගේ මැරෙන මොහොත මේක නෙමේ කියලා.

හැබැයි සුභාරංචිය මම මැරෙන්න බය වුනේ නැහැ. ඇයි? මම දන්නවා. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ.

ජේසු කියන්නේ මොනවද අපිට? ඔබ මා කෙරෙහි විශ්වාස කළොත්, මගේ තාත්තාගේ නිවසේ ගොඩක් කාමර තියෙනවා. මම කුරුසේ ඇණ ගහලා මැරෙන්නේ. මැරිලා මළවුන්ගෙන් උත්ථාන වෙන්නේ, ඔබව ඒ ස්ථානයට ගෙනියන්නයි. ඇයි අප මරණයට බය වෙන්නේ?

දයාබර දරුවෙනි, අන්ධකාරයට බය වෙන්න එපා. අප වටකර, පුබුදුව වටකර කොයිතරම් අන්ධකාරයක් ආවත්, බොහෝ අය කොපමණ දේ කිව්වත්, මේ යුගය අසත්‍යය රජකරවන යුගයක්. බොරුව රජ කරන යුගයක්. රැවටෙන්න එපා බොරුවට. මොන දෙයක් කිව්වත් සත්‍යය සත්‍යයමයි. සත්‍ය වෙනස් කරන්නට කාටවත් බැහැ. සත්‍යයට බය වෙලා අසත්‍යය කිව්වොත් ඒකා පැරදෙනවා. ඒක නිසා බය වෙන්න එපා. මැරුනත් සත්‍යයම කියලා මැරෙන්න. ඔබට තේරෙනවද? මොනතරම් තේජවන්ත අත්දැකීමකටද සමිඳාණන් වහන්සේ අපව කැඳවලා තියෙන්නේ කියලා.

පෙන්තකෝස්තයට ඉස්සෙල්ලා ඒගොල්ලෝ කිව්වා සීසර් අපේ ස්වාමියාණෝ කියලා. පේදුරු තුමා පාරේ යනකොට අනිත් පැත්තෙ එක්කෙනා සීසර් කියන කොට පේදුරු කියන්න ඇති He is Lord කියලා. අන්ද්‍රේ - ජාකොබ් කියන්න ඇති He is Lord කියලා. ජුවාම්නුත් කියන්න ඇති He is Lord කියලා. උන්වහන්සේගේ උත්ථානයෙන් පස්සේ ඒ අය කියනවා සේසරු නෙමේ ස්වාමියාණෝ කියලා. මොන පිස්සුද ඌ නිකන් මිනිහෙක් විතරයි. ඌ කව්ද? ඌ නිකන් මැටි මැන් කෙනෙක් විතරයි අද ඉඳලා හෙට මැරෙන. ඌට කොහොමද මම Lord කියන්නේ. මේ අය ප්‍රතික්ෂේප කළා සේසරු ස්වාමියාණෝ කියන්න. ඔබ එහෙම කියන්න ලෑස්ති ද?

මුළු පුබුදු ජනතාවම එක හඬින් සූදානම් වෙලා ඉන්නවා, මනුෂ්‍ය බලපෑම්වලට යට නොවී සෑම විටම කියන්න ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ කියලා. උන්වහන්සේ ඇරුණු කොට තව ස්වාමියෙක් අපට නැහැ. මොන පිස්සුද? කවුද ස්වාමියා? ක්වීන් එළිසබෙත්, අපේ රටේ නායකයෝ, කව්ද ස්වාමියාණෝ? ඔක්කොම උන් මැරෙනවා. ජේසුගෙ උත්ථානයත් එක්කම උන්වහන්සේ මිනිසුන්ට විතරක් නෙමේ, මුළු විශ්වයේම ස්වාමියාණෝ බවට පත් වුණා. ගස් කොළන්වල, සතා සිව්පාවන්ගේ මුළු විශ්වයේම සෑම වැලි ඇටයකම හැම තලයක්ම අභිබවා ගියා.

මනුෂ්‍යාට අත තබන්න බැරි විදියට පුදුමාකාර ලෙස උන්වහන්සේගේ උත්ථානයෙන් පස්සේ උන්වහන්සේ මුළු විශ්වයේම ස්වාමියාණෝ බවට පත් වුණා. උන්වහන්සේට විනිවිද ගමන් කරන්නට පුලුවන්. මේ මම කථා කරන වෙලාවේ උන්වහන්සේට ඕස්ට්‍රේලියාවේ සංසයේ ඉන්න සෑම කෙනෙක්වම ස්පර්ශ කරන්නට පුලුවන්. මේ මම කථා කරන වෙලාවේ උන්වහන්සේට ඉතාලියේ ඉන්න සෑම කෙනෙක්වම ස්පර්ෂ කරන්න පුලුවන්. ඊශ්‍රායලයේ ඉන්න සෑම කෙනෙකුවමත් ස්පර්ශ කරන්න පුලුවන්. ශ්‍රී ලංකා දේශයේ ඉන්න සෑම කෙනෙක්වම ස්පර්ශ කරන්න පුලුවන්. ජේසුස් වහන්සේ උත්ථාන වුනා පමණක් නෙමේ උන්වහන්සේ ප්‍රථාපවත් වුණා. උන්වහන්සේට ඕන තැනකට, ඕන වෙලාවක විනිවිද යන විදියේ මහා පුදුමාකාර බලයක්. එපමණක් නෙමේ උන්වහන්සේ මේ පොළොවෙත් ස්වාමියාණෝ. ස්වර්ගයෙත් ස්වාමියාණෝ. එපමණක් නෙමේ නිරා දොරටුවේ යතුරත් තියෙන්නේ උන්වහන්සේ ළඟ. යකාට කයිවාරු ගහන්න බැහැ. මොනවද යකාට කරන්න පුළුවන්? ඕනෙ නම් හූ තියයි, ඕනෙ නම් බොරු කියයි, මොනවද ඌට කියන්න පුලුවන්. යතුර තියෙන්නේ ජේසුගෙ අතේ. උන්වහන්සේ

කියනව පලයන් යකා දැන්මම උඹේ කූඩුවට කියලා දොර ලොක් කරන්න පුලුවන්. ස්වර්ගයෙත්, පොලොවෙත්, නිරා දොරටුවලත් සියලු බලය තියෙන්නේ මළවුන්ගෙන් උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේටයි.

මේ රහස, මේ පුදුමාකාර අනාවරණය ඒ අය දැක්කේ සේනාකුළු ශාලාවේ ඒ පුදුමාකාර අත්දැකීම ශුද්ධාත්මයාණන් වහන්සේව ලැබුවාට පස්සෙයි. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් තොරව කිසිම මිනිසෙකුට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ කියලා කියන්න බැහැ. ඒ නිසා තමයි ස්වාමි තාත්තා අපට ඉගැන්නුවේ සත් ප්‍රකාරයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට සම්බන්ධ වෙන්න. ශුද්ධාත්මයාණන් වහන්සේට බැඳුනු ජීවිතයක් ගත කරන්න. ශුද්ධාත්මයාණන්ට බද්ධ වෙලා ඉන්න. හැම වෙලේම ශුද්ධාත්මයාණන්ට අවදි වෙලා ඉන්න. එතකොට බොරු කියන්නත් බැහැ. ක්‍රිස්තුන් වහන්සේනේ ස්වාමියාණෝ, ඒ වගේ දිවකින් වෙන එකෙක් ස්වාමියාණෝ කියලා කියන්නෙත් නැහැ. බොරු කියන්නෙත් නැහැ.

ඒක නිසා 1කොරෙන්ති 12:3 තියෙනවා, "එබැවින් දේවාත්මයාණන් කරණකොටගෙන කථා කරන කිසිවෙකුට ජේසුස් වහන්සේ ශාප ලද්දෙක් යැයි නොකියන බවද, ශුද්ධාත්මයාණන් කරණකොටගෙන මිස ජේසුස් වහන්සේ ස්වාමින් වහන්සේ යයි කීමට කිසිවෙකුට නොහැකි බව ද මම ඔබට තරයේ කියමි." මෙන්න අපි වාගේ අතරමගදී ජේසු ඉන්න කාලෙම ජීවත් වෙලා, ජේසුව දැකලත් නැති පාවුළු තුමා කොරින්ති වරුන්ට ලියූ ලිපියේ කියනවා, ජේසුස් වහන්සේ ස්වාමියාණෝ ය කියලා. මොනතරම් පුදුමාකාර අලංකාර අත්දැකීමක් ද? ඒ වගේම ක්‍රිස්තුන් වහන්සේ නැතිව අපට පියාණන් වහන්සේ ළගට යන්නත් බැහැ. ශුද්ධාත්මයාණන් වහන්සේ නැතිව අපට ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණන්

කියලා කියන්නත් බැහැ. ඒ කියන්නේ මොකද්ද මේකෙ තේරුම? ශුද්ධවූ ත්‍රිත්වයම ජේසුයි. පියාණන් වහන්සේයි ශුද්ධාත්මයාණන් වහන්සේයි එකට බද්ධ වෙච්ච පුදුමාකාර තේජාන්විත ජීවිතයකට අපව කැඳවලා තියෙන්නේ. දේව තාත්තා මොකද කළේ?

දේව තාත්තා අපට ගොඩක් ආදරේ කළා. උන්වහන්සේ හැදුවා - හැදුවා - හැදුවා මිනිසුන්ව දේව වචනයට කීකරු කරලා ලස්සන ජීවිතයක් දෙන්න. මිනිසා ඕක අහන්නෙම නැහැ, හැමදාම අකීකරු වෙනවා. අන්තිමට පියාණන් වහන්සේට මේක දරාගන්න බැහැ. උන්වහන්සේ කොතරම් අපට ආදරේ කළාද කිව්වොත් ශු.ජුවාම් 3:16 කියනවා, "දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළසේක්ද කීවොත්, ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුවද ලොවට දෙවා වදාළ සේක." දෙවියන් වහන්සේව මනුෂ්‍යයෙක් කළා. මේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාව අපි වගේ නිකන් මනුෂ්‍යයෙක් කළා. හැඟීම් තියෙන, බඩගිනි වෙන, නිදියන්න ඕනේ, දුක දැනෙන, තරහව යන මනුෂ්‍යයෙක් හැටියට ලෝකයට තමුන්ගේ පුතාව එව්වා.

ප්‍රේමවන්තයිනි, මගේ යාච්ඤාව තුළ මට හැඟුනා අපට අද දවසේ ජේසුස් වහන්සේගේ ස්වාමිත්වය ප්‍රබලව අත්දකින්නට නම්, ඒකට ඇතුල් වෙන්නට නම් අපි ස්ථාන 2ක් අද දවසේදී භාවනා කරන්න ඕනේ කියලා. පළවෙනි ස්ථානය තමයි කුරුසේ පාමුල. දෙවන ස්ථානය තමයි සේනකුළු ශාලාව. මේ දෙක දෙස අපි බලන ප්‍රමාණයට අපිට ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වයට මේ ස්වර්ණ ජයන්තියේ පුදුමකාර ලෙස අත්දකින්නට ඇතුල් වෙන්නට පුලුවන්.

දෙවියන් වහන්සේ ආබ්‍රහම්ව කැඳෙව්වා, මෝසෙස්ව කැඳෙව්වා, තව ගොඩක් අයව කැඳෙව්වා, ජනතාවක් රැස්

කළා මෝසෙස් තුළින්. ඒ තුළින් හැදුවා දෙවියන් වහන්සේගේ ආදරය මිනිසාට පෙන්වන්න. හැබැයි මිනිසා හැමදාම කැරළි ගහනවා. මිනිසා හැමදාම දෙවියන් වහන්සේට අකීකරු වෙනවා. මට හම්බ වුනා ඉතාම අලංකාර කොටසක් නික්මයාම පොතේ. නික්මයාම 3:1-6 දක්වා. එහි මෙසේ සඳහන් වෙනවා. (දේව ප්‍රකාශනය කියවීම)

මෝසෙස් කැඳෙව්වාවූ මේ ආදරවන්ත මිනිසා පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ ළඟට යන්න බය වුනා. ඒ නිසා මුළු පුරාණ ගිවිසුම තුළම දෙවියන් වහන්සේට කිව්වේ භයංකාර දෙවි කෙනෙක්. ළං වෙන්න බැරි දෙවි කෙනෙක්. ළං වුනු ගමන ගින්දර, පිච්චිලා යනවා. එහෙත්, දෙවියන් වහන්සේ පූර්ණ ප්‍රේමයයි. දෙවියන් වහන්සේ ආරම්භ කරනවා දවසින් දවස උන්වහන්සේගේ ප්‍රේමය දිගහැර ගෙන දිගහැර ගෙන එන්න. මිනිසාට මේ ප්‍රේමය තේරෙන්නේ නෑ. මිනිසා දෙවියන් වහන්සේට එරෙහිම වෙනවා. දෙවියන් වහන්සේ මිනිසාට කොතරම් ආදරය කළාද කිව්වොත් පුදුම දෙයක් දෙවියන් වහන්සේ කළා. දෙවියන් වහනසේ තම පුත්‍රයාව මිනිසෙක් කරලා ලෝකයට එව්වා පමණක් නොවෙයි, තම පුත්‍රයාව මිනිසුන්ගේ දෑතට බාර දුන්නා. මිනිසුන්ට උන්වහන්සේව අල්ලලා ඉඹින්න තිබ්බා. උන්වහන්සේගෙන් ප්‍රාතිහාර්ය ලබා ගන්න තිබ්බා. නමුත් ඔවුන් මොනවද කළේ? අර සීනයි කන්දේ ගිනි පඳුර වාගේම කල්වාරි කන්දේ ගිනි පඳුරක් ඇවිලෙන්න පටන් ගත්තා. ඒ කුරුස ගහයි. ඔවුන් ජේසුව අල්ලලා, කුරුස ගහේ ඇණ ගහලා මරා දැම්මා. නිකන් මරා දැම්මෙත් නැහැ, වද හතම දුන්නා. වද හතටත් වඩා දුන්නා. මූණට කෙල ගැහැව්වා. කුනුහරුපත් කියන්නට ඇති. උඹ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් බහින්නකො පල්ලෙහාට. ඔය වගේ කැත කථා ජේසුට එච්චර කිව්වා.

දැන් දෙවියන් වහන්සේ ළඟට මිනිසාට ළං වෙන්න විතරක් නෙමේ, මිනිසාට පුලුවන් වුණා මේ මැවුම්කාරවූ දෙවියන් වහන්සේව අල්ලලා මරලා දාන්න. දෙවියන් වහන්සේ මිනිසාට ඒ තරම්ම ළං වුණා. මිනිසාට ළං වෙන්නට, ළං වෙන්නට මිනිසා දෙවියන් වහන්සේගේ නාමය ලැජ්ජාවට පත් කළා. කෙල ගැහැව්වා මූණට. කටු ඔටුන්නක් පැළඳුවා. දැන් මේ ඔක්කොම වද දීලා ජේසුව මරද්දී ජේසුගේ අම්ම කුරුසේ පාමුල. ඒ නිසා ස්වාමින් වහන්සේට ආදරේ කරන්නට නම්, "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ" කියන අත්දැකීම ලබන්නට නම් කුරුසියේ පාමුලට යන්නට යන්නට අපිට ස්වාමින් වහන්සේ කෙරෙහි ඇති වෙන්නාවූ ආදරය. අර සීනයි කන්දේ මෝසෙස්ට ළං වෙන්න එපා කියපු දෙවියන් වහන්සේ මෙන්න මිනිසාට ඉඩ හරිනවා ඒ දෙවියන් වහන්සේව කල්වාරි කන්දේ මරන්න. ඒ ගින්න අර ගිනි පඳුරට වඩා කොයි තරම් දැවී යන ගින්නක් වෙන්නට ඇතිද? දේව මෑණියන්ගේ හදවත කුරුසේ එල්ලී සිටින ජේසු දේව මෑණියන් දිහා බලලා කියනවා, අර ඉන්නේ ඔබගේ පුතා, පුතාට කියනවා මේ ඔබේ අම්මා. දේව මෑණියන්ගේ ගින්න මොනවද වෙන්නේ කියලා හිතන්න නම් නිශ්චලව තවත් දේව මෑණියන් දිහා අපි ඔක්කොමල්ලා බලාගෙන ඉන්නට ඕනේ.

මට මගේ යාච්ඤාවේදී හිතුනු දේ මම ලියා ගත්තා. මට හිතුනා, දේව මෑණියෝ කියන්නට ඇති එසේය! එසේය! මම ඔබේ අම්මා නෙමේ දැන්, ඔබ මාව විශ්වයීය අම්මා බවට පත් කළා. ජුවාම්ගේ අම්මා කියන්නේ මෙතන ඉන්න මුළු පුබුදු ජනතාවගෙත්, මුළු විශ්වයේ ඉන්න ජනතාවගෙත් අම්මා බවට මාව පත් කළා. උන්වහන්සේට මට දැන් අම්මා කියන්නත් බැහැ. ආමෙන් ආමෙන්. මේ වචනය කොයිතරම් ඇත්තද කියලා දේව මෑණියෝ භාවනා කරන්නට ඇති. ඉන් පස්සේ දේව

මැණියෝ කියන්න ඇති, ඔව් ඔබවහන්සේ ස්වාමියාණෝ. දේව මැණියෝ ජේසුගෙ කුරුස පාමුල ඉද්දි කියන්න ඇති ඔබවහන්සේ ස්වාමියාණෝ. ඔබවහන්සේ ක්‍රිස්තුස් වහන්සේ. උන්වහන්සේගේ උත්ථානය කුරුස පාමුලදීම දැක්කා. මට කාවද අදහන්නට පුලුවන්. ඔබවහන්සේ කෙරෙහි මට ගැළවීම තියෙන්නේ. ඔබවහන්සේ මාගේ ස්වාමියාණෝ. ඔබවහන්සේ මුළු විශ්වයේම ස්වාමියාණෝ. ඔබවහන්සේ ජුවාම්ගේ ස්වාමියාණෝ. මේ මෙතන ඉන්න අසරණ ස්ත්‍රීන්ගේ ස්වාමියාණෝ. මගේ මුළු පැවැත්මම ඔබවහන්සේ තුළයි. මුළු මිනිස් සංහතියටම ගැළවීම ඔබවහන්සේයි. ඔබවහන්සේ කිව්ව දේ හරියි කියලා, ඉතාම නිශ්ශබ්දව කුරුසෙ පාමුල දේව මැණියෝ ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය බාර ගන්න ඇතියි කියලා ඊයේ රාත්‍රියේදී මගේ යාච්ඤාවේදී මට දැනුනා.

මම ඔබට සුබ ආරංචියක් කියන්නට යනවා. "ස්වාමින් වහන්සේගේ නාමයෙන් දුක් විඳින්නන් උන්වහන්සේ උසස් කරනවා." මේක පුදුමාකාර සුභාරංචියක්. ඒ දුක් විඳීම තුළ බලන්න දේව මැණියෝ කෙලින් සිටගෙන ඉන්න හැටි. ඇයි කෙළින් හිටන් ඉන්නේ? ජේසුට එච්චර ආදරෙයි. මේ ජේසුගෙ දූත කාර්යය ඉවර වෙනකන් දේව මැණියෝ බලාගෙන ඉන්නවා. He is The Lord උන්වහන්සේ මේ ලෝකයට ආවේ ඒකටයි. ඒක දැක ගන්නත් බලා ඉන්නවා. අද දේව මැණියෝ කෙහෙද ඉන්නේ? ස්වර්ගීය රාජේශ්වරියයි. ඔටුනු පැළඳූ අම්මායි. අද පේදුරු තුමා කොහෙද ඉන්නේ? පේදුරු තුමා ශුද්ධවන්තයෙක්, ස්වර්ගයේ ඉන්නේ. එතකොට දුක් විඳීමේ ප්‍රීතිය, දුක් විඳීමේ ජයග්‍රහණය.

ඒ නිසා අපට ලැබෙන මේ දුක් පීඩාවලට අපි සටන් කරලා අපිට දුක් පීඩා එපා කිව්වොත් අපි ක්‍රිස්තුන් වහන්සේගේ සොල්දාදුවෝ නෙමෙයි. ඒ දුක් පීඩා තුළ

ස්වාමින් වහන්සේ අපව පවිත්‍ර කරනවා. මේ පහුගිය දිනවල එක්තරා කෙනෙක් මාව හමුවෙන්න ආවා. මා එක්ක කථා කරනවා, මා ඒ පුද්ගලයාට කියනවා, මාගේ හෘද වස්තුව පැළිලා, මගේ හෘද වස්තුවෙන් ලේ ගලනවා. මගේ ඇතුලේ කාටවත් පේන්නෙ නැහැ. ඔයාට පේන්නෙත් නැහැ. ඒත් මම මිනිසුන්ට, මේ දයාබර ජනතාවට තියෙන ආදරේ නිසා මා කෙළින් හිටන් ඉන්නවා කියලා මම බෙදා ගනිද්දිම මට දැනුනා මගෙන් ජීවනදායක ප්‍රේමයක් පුබුදුව වෙත ගලා ගෙන ගියා කියලා. දුක් විඳීම ආනන්ද ජනකයි. සුභාරංචිය වෙනුවෙන් දුක් විඳිම. අපේ මැට්ටොත් ඉන්නවනෙ එක එක මිනිස්සු දුක් විඳිනවනෙ එක එක දේවල් වලට. පගා ගන්න දුක් විඳිනවා. වාසි ගන්න දුක් විඳිනවා. එක එක ජල්තර කේසස් ඕනතරම් ඉන්නවා. හැබැයි එහෙම ජල්තර නෙමේ, ස්වාමින් වහන්සේ සහ උන්වහන්සේගේ රාජ්‍යය උදෙසා දුක් විඳින්න තියෙන අවස්ථාවන් පැහැර අරින්න එපා. විඳින්න දුක ස්වර්ග රාජ්‍යයේ ඔබට ලැබෙන ආනන්දයයි ප්‍රීතියයි අති මහත්. අතී මහත්.

බලන්න දේව මැණියෝ තුළ තිබෙන නිර්භීතකම. එක පුතෙක් මට ඇවිල්ලා ළඟදි දවසක කියනවා, අම්මා මං මේ ශුද්ධාත්ම මංගල්‍ය වෙලාවේ නිර්භීතකම ඉල්ලන්නට ඕනේ කියල. ඒ පුතා විතරක් නෙමේ ඔබත් මමත් ඉල්ලමු අද නිර්භීත හදවතක්, අවංක හදවතක්, සත්‍යය වූ හදවතක්, බොරුවට නිර්භීතව හිටගෙන ඉන්න හදවතක්, බොරු කියද්දී බය වෙන්න එපා. ස්වාමින් වහන්සේ 365 සැරයක් ශු. බයිබලයේ කියලා තියෙනවා "බය වෙන්න එපා" ගොඩක් වෙලාවට ඒ එක්කම කියනවා. "මක්නිසාද මම නුඹ සමඟයි" කියලා. ඒ නිසා බය වෙන්න ඕනේ බොරු කියන අයයි. ඇත්ත කියන අය බය වෙන්න එපා. නිර්භීතව බෙල්ල කපලා ගියත්, බෙල්ල ගහලා ගියත් ඇත්ත කියලා මැරෙන්න. ඇත්ත බොරුව

වෙන්නෙ නැහැ. බොරුව ඇත්ත වෙන්නෙත් නැහැ. ඇත්ත අවසානයේදී ජයග්‍රහණය කරනවාමයි. ස්වාමීන් වහන්සේගේ ගෝලයෝ කියනවා ජේසුට ස්වාමිනී, ජෙරුසලමට යන්න එපා, අරුන් ඔබවහන්සේව මරන්න බලන් ඉන්නේ. ස්වාමීන් වහන්සේ කියනවා ගිහින් කියපන් අර හිවලට මම මේ නගරයේ දවස් ගාණක් දේශනා කරනවා කියලා. ඒ පිලාත් කියන හිවලට ජේසු බය වුනේ නැහැ. උන්වහන්සේ සත්‍යයට සාක්ෂි දරන නිසා. උන්වහන්සේ ඔහුට කියනවා ඔබට බැහැ මගේ ශරීරයට අත තියන්න. ස්වර්ගයේ මගේ තාත්තා ඔබට බලය දුන්නේ නැත්නම්. උන්වහන්සේ නිර්භීතව කුරුස ගහට යනවා.

ප්‍රේමවන්තයිනි, ඔබටයි මටයි ඇතිවෙන ප්‍රශ්ණ හමුවේ කඩා ගෙන පැනලා දුවන්න එපා, අඬන්න එපා, එඩිතරව මුහුණ දෙන්න. මොන දෙයක් වුනත් සත්‍යය ජයග්‍රහණය කරනවාමයි. එතකොට මොනවද වෙන්නේ? මේ අපේ දුක් කම්කටොළු බාධක සියල්ලම ආනන්ද ජනක අත්දැකීම් බවට පෙරළෙනවා. ප්‍රීතිමත් අත්දැකීම් බවට පෙරළෙනවා. ජයග්‍රාහී අත්දැකීම් බවට පෙරළෙනවා. බලන්න මේ කුරුසේ පාමුල වගේ අන්ධකාර පැයක් මුළු ලෝකයේම ඉතිහාසයේ එයිද කියලා බලන්න. මට හිතෙනවා ලෝක ඉතිහාසයේ ආදම්ගේ ඉඳලා අද වෙනකනුත්, අද ඉඳලා දෙවෙනි පැමිණීම දක්වාත් ලෝක ඉතිහාසයේ දරුණුම පැය කුරුස පාමුල කියලා. ඒ භූගෝලීය වශයෙනුත් අන්ධකාර වුණ හැටි සුවිශේෂක ගත්කරුවන් පෙන්නලා දෙනවා. ඉර අනිත් පැත්තට හැරුණා. ආලෝකය දුන්නෙ නැහැ, ගැඹුරුම අන්ධකාරයක්. නමුත් මේ අන්ධකාරය තුළ දේව මෑණියෝ ආලෝකය දැක්කා. මේ අන්ධකාරය තුළ අපිත් ආලෝකය දකිමු.

එක්තරා ශ්‍රේෂ්ඨයෙක් අපව හමු වුණු අවස්ථාවේදී එතුමා අපට කිව්වා, දැන් ඔබ පසු කරන්නේ දුබ අබිරහස් තමයි ඔබ දැන් පසුකරන්නේ. ඔබ මේ දුබ අබිරහස් පසු කළාට පස්සේ ඔබට සංතෝෂ අභිරහස් එනවා. ඔබ සංතෝෂ අභිරහස් පසු කළාට පස්සේ ඔබට මහිමාන්විත මහිමයෙන් පිරිච්ච අභිරහස් ඔබට අත්දකින්න පුලුවන්. අපි බලාගෙන ඉම්මු ඒ පැය. මේ පැය මේ ස්වර්ණ ජයන්තියත් එක්කම උන්වහන්සේට උවමනා පැයේදී අපිට තෑගි කරයි. එතකන් අපි ඉවසිලිවන්තව උන්වහන්සේ කෙරෙහිම අපගේ විශ්වාසය තබමින් අපි ගමන් කරමු.

දැන් කුරුසේ පාමුලට ගිය කට්ටිය දිහා බලන්න. ඒගොල්ලෝ කොච්චර ජේසුට ආදරේද? දැන් කුරුසේ පාමුලට කෙනෙක්ට යන්න පුලුවන් ඒ පුද්ගලයා ජේසුට ඉමහත් සේ ආදරය කරනවා නම් විතරයි. බලන්න ටික දෙනානේ කුරුසිය පාමුල හිටියේ. අනිත් අය බයෙන් පැනලා දුවලානේ. නමුත් ඒ අය ලබා ගත්ත අත්දැකීම. ඔබගෙන් කවුරු හරි ඇහැව්වොත් මෙතන පේදුරු තුමයි ජුවාම් තුමයි ඇවිල්ලා ඉඳගෙන ඉන්නවා. කුරුසේ පාමුල අත්දැකීම ගැන කථා කරන්න ඔබ කාවද තෝරා ගන්නේ? පේදුරු නැහැ හැංගිලා. අපි ජුවාම්ව තෝරා ගන්නවා ඒ අත්දැකීම ඔහු ලබපු නිසා. ඒ සියල්ලන්ට වඩා දේව මෑණියන්ව පුළුවන්නම් අපි තෝරා ගනියි, දේව මෑණියෝ පුදුමාකාර විශ්වාසයකින් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වය කුරුසියේ පාමුල ඉඳලම එතුමිය අත්දැක්ක නිසා.

ප්‍රේමවන්තයිනි, මට ආසයි කුරුසේ පාමුල ජේසු කියපු එක වචනයක් මම ඔබ සමඟ බෙදා ගත්තා. "මෙන්න ඔබේ අම්මා - මෙන්න ඔබේ පුතා කියලා." මට ආසයි තව එක වචනයක් ඔබ සමඟ බෙදා ගන්න. උන්වහන්සේ කියනවා, "සියල්ල අවසානයි. සියල්ල හමාරයි. සියල්ල නිමා විය". මේ සඳහා ග්‍රීක් වචනය තමයි, "ටෙටලෙස්ටායි." ටෙටලෙස්ටායි

කියන ග්‍රීක් වචනය ඒ කාලයේ හිටිය ජුදා ජාතිකයන්ට, ජේසුටත් මේ වචනය හොඳටම හුරුයි ටෙටලෙස්ටායි කියන වචනය. සාමාන්‍යයෙන් ටෙටලෙස්ටායි කියනවා, වහලෙක් තම ස්වාමියා ළඟට ගිහිල්ලා, ස්වාමියා බාර දුන්නා නම් වැඩක් වහලා ඒක කළේ නැත්නම් ඉවරයිනේ. ඒක තිතට කරලා ස්වාමියා ළඟට ඇවිල්ලා කියනවා ටෙටලෙස්ටායි ඒක ඉවරයි. දැන් ජේසු කුරුසෙ ගසේ ඉඳලා කෑගහලා කියනවා ටෙටලෙස්ටායි. කොච්චර ආනන්ද ජනකද? ඒ කියන්නේ උන්වහන්සේ ස්වාමියාණෝ වුනේ නිකන් සීනිබෝල, සූකිරි කාලා නෙමේ, අපේ රටේ උන් ලොක්කෝ වෙන්න හදන්නේ සූකිරි කාලානේ. ජේසු ස්වාමියාණෝ වුනේ සූකිරි කාලා නෙමේ, කුරුසේ ඇණ ගහලා ටෙටලෙස්ටායි. අන්තිම ලේ බිංදුව දක්වාම හලලා තමයි තාත්තට ඒක කියලා උන්වහන්සේ මුළු විශ්වයේම ස්වාමියාණන් බවට පත් වුනේ.

ඒ වගේම ඒ වචනය පාවිච්චි කළාලු බිස්නස් කාරයෝ, ව්‍යාපාරිකයෝ. ඒගොල්ලන් මිනිසුන්ගෙන් සල්ලි අරගෙන බඩු විකුණලා, ඉඩම් විකුණලා හරි ගානට සල්ලි දුන්න දවසට එයාට රිසිට් එකක් දෙනවලු, ඒකෙ ගහනවලු ටෙටලෙස්ටායි කියලා. ඒ කියන්නේ ගනුදෙනුව ඉවරයි. ඒ වගේම ණයක් ගත්තහම ආයෙ ටෙටලෙස්ටායි කියනවලු, ණය සම්පූර්ණයෙන්ම ඉවරයි කියලා. ඒ වගේම උසාවියේ දඬුවම් දුන්නහම දඬුවම සම්පූර්ණයෙන් අවසාන නම් ඔහු කියවාලු ටෙටලෙස්ටායි. යුද්ධයකදී ඒක ඉවර වුනහම දින්න ගමන්ම ආයි කියනවලු ටෙටලෙස්ටායි කියලා.

ක්‍රිස්තුන් වහන්සේ මේ වචනය කුරුස ගසේ පාවිච්චි කරලා උන්වහන්සේ තාත්තට ඉස්සෙල්ලම කියනවා තාත්තේ, අවසානයි. මගේ හැම ලේ බිංදුවක්ම හළලා ඉවරයි. මෙන්න මුළු විශ්වයටම ගැළවීම දායක ප්‍රේමය දීලා හමාරයි.

මිනිසුන්ගේ ගැළවුම්කරුවාණන් බවට මම පත් වුණා. මම ඔවුන්ට ගැළවීම ලබා දුන්නා. යුද්ධය කාට විරුද්ධවද? යක්ෂයා - ලෝකයා - මාංශයාට විරුද්ධව. සටන මම ජය ගත්තා. කවුරු උදෙසාද? උන්වහන්සේ ප්‍රේම කරන මේ ලෝකයේ මිනිසුන් උදෙසායි. මං උදෙසා නොවෙයි. ඊට පස්සේ සතුරා නැහැ, යක්ෂයා අද දත් හැලිච්ච සිංහයෙක් විතරයි. උෟ දුවගෙන එද්දි සිංහයෙක් එනවා කියලා අපි දුවයි, නමුත් උගෙ දත් නැහැ. උගෙ සයිස් එකට දුවනවා බය වෙලා. යක්ෂයාගේ බලය ඉවර කළා. ලෝකයාව, මාංශයාව උන්වහන්සේ ජය ගත්තා. ඔබවහන්සේගේ කටයුත්ත කුරුසිය තුළ මම හමාර කළා.

ප්‍රේමවන්තයිනි, මේ යාච්ඤාවේ මට තවත් අපූරු වචනයක් හම්බ වුණා........ ඒ පූජාව ඔප්පු කරන පූජකයාට විතරයි ශුද්ධස්ථානයට ඇතුල් වෙන්න පුලුවන්කම තිබුනේ........ සුවිශේෂක ගත්කරුවන් කියනවා ‘තිරය දෙකඩ වුනා’ කියලා....... තිරය කියන්නේ මොකද්ද? හෙබ්‍රෙව් සංදේශයේ........ ජේසුගේ ශරීරය දෙකට ඉරිලා කැබලි වුණා. උන්වහන්සේගේ කුරුසියේ මරණය නිසා. උන්වහන්සේ තුළින් අපට දේව තාත්තා ළඟට යන්නට පුලුවන්. ස්වර්ගය පොළොවට ආවා. දෙවියන් වහන්සේට අපට අබ්බා තාත්තා කියා කථා කරන්න පුලුවන් වුනා. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ. අපි උන්වහන්සේගේ පුත්‍රයාණෝ නෙමේ, ජේසු දිහා බලලා තමයි තාත්තා කිව්වේ “ඔබ මාගේ පුත්‍රයාණෝ” කියලා. නමුත් ජේසුගේ ශරීරය දෙකට ඉරිලා කැබලි වෙද්දී ක්‍රිස්තුන් වහන්සේ තුළින් අප සියලු දෙනාටම පියාණන් වහන්සේ වෙතට යන්නට, පියාණන් වහන්සේට අබ්බා තාත්තා කියලා කථා කරන්නට උන්වහන්සේ අප දිහා බලලා ජේසුව කොහොමද හිම මෙන් දකින්නේ? තාත්තා අද අප සියළු දෙනාවම හිම මෙන් උන්වහන්සේ දකිනවා. ඇයි?

ඒ බැටළු පෝතකයාණන්ගේ රුධිරයෙන්, ඒ පුත්‍රයාණන්ගේ රුධිරයෙන්, දෙවියන් වහන්සේගේ රුධිරයෙන්. පාපයක් නොදත් ස්වාමින් වහන්සේගේ රුධිරයෙන්. උන්වහන්සේ තුළින්, උන්වහන්සේ නිසා, උන්වහන්සේ සමඟ අපට ස්වර්ග යට යන්න පුළුවන්.

දෙවි පියාණන් වහන්සේට අබ්බා තාත්තාට අර මෝසෙස්ට ළං වෙන්නට බැරි වුනු දේව තාත්තාට තාත්තේ කියා කථා කරන්න පුලුවන්. ජුදා ජාතිකයන් ජේසුව මරන්න එක හේතුවක් තමයි ජේසු පියාණන් වහන්සේට "අබ්බා තාත්තා" කියලා කිව්වා. එක්තරා අවස්ථාවක ඔවුන් ගල් ගන්නවා. ජේසු අහනවා මේ මිනිසුන්ගෙන් මම මෙච්චර යහපත් දේ කරද්දී ඇයි ඔබ ගල් ගන්නේ මට ගහන්න, මාව මරන්න කියලා. ඔවුන් ජේසුට කියනවා ඔබට ගල් ගත්තේ මරන්න, ඔබ යහපත් දේ කරන නිසා නොවෙයි, අප වාගේ මනුෂ්‍යයෙක් වන ඔබ මේ දෙවියන් වහන්සේ, අර මෝසෙස්ට ළං වෙන්නට බැරි වුනු දෙවියන් වහන්සේ, ගිනි පඳුර ළඟට ළං වෙන්න බැරි වුනු මේ දෙවියන් වහන්සේට ඔබ කොහොමද ඔබේ අබ්බා කියන්නේ? තාත්තා කියන්නේ? ඒත් ජේසු ඒගොල්ලන්ට බයේ අසත්‍ය කිව්වෙ නැහැ. උන්වහන්සේ මගේ "අබ්බා තාත්තා - තාත්තා" මයි කිව්වා .

ඒ පරණ ගිවිසුමේ භයංකාර දෙවියන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ නිසා, උන්වහන්සේගේ මරණය නිසා, උන්වහන්සේගේ උත්ථානය නිසා, උන්වහන්සේගේ ස්වාමිත්වය නිසා අපට දේව තාත්තා ළඟට යන්න මහා දොර විවෘත වුනා. උන්වහන්සෙයි මාර්ගය. එහෙම නම් ප්‍රේමවන්තයිනි, අපි ජේසුට කොච්චර ආදරේ කරන්න ඕනෙද? අපි කොච්චර ජේසු උදෙසා ජීවිතය දෙන්නට ඕනෙද? ඔබ සියලු දෙනාම මේ දින ගණනාව තුළ ඔබට නින්දක් නැහැ, ඔබ රෑ දහවල් නොබලා, අව් වැසි නොබලා ඔබේ ජීවිතය

තෑගි කළේ ඔබ උදෙසා තිරය ඇරපු ඒ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නිසයි. උන්වහන්සේගේ ස්වාමිත්වය නිසයි.

ඒ නිසා ප්‍රේමවන්තයිනි, අපි සියලු දෙනාම ඉමහත් ප්‍රීතියෙන් දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ සාක්ෂි කාරයෝ වෙමු. අපි ගොඩක් වෙලාවට කියනවනේ 'මේක කරන්න' 'Do it' කියල. තාත්තා ජේසුට 'Do it' 'Do it' කිය කිය හිටියෙ නැහැ. ජේසු ඉවර කරල කිව්වා, "It's done" "It's finished" "Finitho" "සියල්ල නිමකළා, සියල්ල අවසන්" උන්වහන්සේ තුළින් අපට ස්වර්ගය දැක ගන්න පුලුවන්. දේව තාත්තා අප අතරට පැහැදිලිව වැඩම කරනවා.

පේදුරු තුමාගේ දේශනාව සේනාකුළු ශාලාවෙන් එළියට ආව ගමන ඉස්සෙල්ලාම කිව්වේ "ජේසුස් වහන්සේ ස්වාමියාණෝ ය" කියලා. ශුද්ධාත්මයාණන් අත්දැක්ක ගමන අර බියගුල්ලා නිර්භීත එකෙක් වෙලා. පුබුදුවෙ උන් ඔක්කොමල්ලා අද නිර්භීත උන් වෙන්නට ඕනේ. මොකටද නිර්භීත වෙන්නේ? "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ" කියන්නටයි. අනිත් නිකන් පැංච වැඩවලට නෙමේ. උන්වහන්සේ ස්වාමියාණෝ කියන්න බය වෙන්න එපා. ඒක තමයි සත්‍යය. පාවුලුතුමා නොබියව ප්‍රසිද්ධියේම දෙවියන් වහන්සේගේ රාජ්‍යය දේශනා කරමින් "ස්වාමින් වන ජේසුස් වහන්සේ" ගැන තමයි අනුශාසනා දුන්නේ.

ඔබට දෙන අවසාන වචනය. පුබුදුවේ අපට දෙවියන් වහන්සේ මහත් දේවල් කරලා තියෙනවා. අපි ඒ ගැන පුරසාරම් දොඩන්න නෙමේ, අපි මේ ස්වර්ණ ජයන්තිය පවත්වන මේ උතුම් දවසේදී අපි බැහැපත් වෙන්නට ඕනේ. අපි අපේ පාපය පිළිගන්නට ඕනේ. අවුරුදු 50ක් පුරා කිතු දන පුබුදුවේ කවුරු හරි අතින් වුනු පාපයට අපි සමාව ඉල්ලන්නට ඕනේ ස්වාමින් වහන්සේගෙන්. සමාව ඉල්ලනවා විතරක් නෙමේ

අපි පිළිගන්නට ඕනේ කිතු දන පුබුදුව තුළින් මේ මේ වැරදි සිදුවෙලා තියෙනවා කියලා. දෙවියන් වහන්සේගේ ප්‍රේමය බහුලව අත්දකින්නට පුලුවන් පාපය පිළිගන්න එක්කෙනාටයි.

ඒ නිසා අපි අද දවසේදී මේ වසර පුරා අපි අවදි වෙමු මේ අවුරුදු 50 පුරාම අපි බැහැපත් වෙමු. අපි අතර පුදුම දේවල් දෙවියන් වහන්සේ කරලා තියෙනවානේ. බලන්න තාත්තා ඉන්නවා පැල්පතක. කාටද ඉන්න පුලුවන්. මම හිතන්නේ නැහැ මම මැරෙන දවස වෙනකන් කිසිම ස්වාමි කෙනෙක් දකියි කියලා පැල්පතක. ඒක වැරැද්දක් නොවෙයි. නමුත් ස්වාමි තාත්තාට මේ දර්ශනය, මේ දැක්ම, මේ කැරිස්මාව උන්වහන්සේට දීලා තියෙන නිසා උන්වහන්සේ ඒකට විරුද්ධව ගියේ නැහැ. ඒක තමයි අලංකාරය අපි දකින, අපි ඉගෙන ගන්නට ඕනේ. එතකොට එහෙම නම් අපේ චාමි සරල ජීවිතය, අපේ සරල විවාහ මංගල්‍යය ඒ සියල්ලම ඒ ඉගැන්වීම් අනුව සමාජය ගළවා ගැනීමේ දූත කාර්යයේ අපි යෙදෙන්නට ඕනේ. ඒ වගේම සොබා දහමට. "ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ" කියද්දී අමතක කරන්න එපා උන්වහන්සේ සොබා දහමෙත් ස්වාමියාණෝ. ඒ නිසා බොරුවට ගස් කපන්න, විකුණන්න අපි කාටවත් අයිතියක් නැහැ, විරුද්ධව නැගී සිටින්න ඕනේ නම් විරුද්ධව නැගී සිටිමු.

ඒ වගේම සමාව ඉල්ලනවා විතරක් නෙමෙයි සමාව දෙන්නට අපි සූදානම් වෙලා ඉන්නට ඕනේ විශේෂයෙන් මේ ජුබිලි වසරේ. මේ අන්ධකාර අවුරුදු 2ක් තුළ අපි වින්දාවූ දුක තුළ අපිව තනි කළ අපට විරුද්ධව බොරු චෝදනා නැගුවාවූ ඒ අයට අපි සමාව දෙන්නට ඕනේ අවංකවම. ඒ අයගේ ඇස් දෙක දිහා බලලා කතා කරන්න ඕනේ. කෙනෙක් ෆේස් බුක් එකේ දානවා ඩෙල්රින් තාත්තටයි, මටයි සල්ලි ඕනේ නම්

සල්ලි ඔක්කොම අරන් යන්න මේ ප්‍රශංසාරාම භූමිය අපට දීලා. හැබැයි ඒ අයට අපි සමාව දෙන්න ඕනේ. අපිව ලැජ්ජා කරාට, කමක් නැහැ. සත්‍යය සත්‍යයමයි. සත්‍යයට විරුද්ධව කාටවත් සටන් කරලා ජය ගන්න බැහැ. ඒක නිසා මම ඔබට කියනවා අවංකව ඒ අයට අපි සමාව දෙමු. මේක පුංචි එකක් විතරයි.

මේ දවස්වල හැම මීසමකම වගේ අපේ මිනිස්සු ප්‍රශ්න වලට මුහුණ දීලා අපි ළඟට දුවන් එනවානේ. කමක් නැහැ, සමාව දෙන්න. ඉවසමු. සමාව දෙමු. දුක අභිරහස්, සංතෝස අභිරහස්, ඊට පස්සෙ මහිමාන්විත අභිරහස්. ඒ තුන අපිට උන්වහන්සේ ලබලා දෙයි උන්වහන්සේගේ පැයේදී. ඒ නිසා මම ඔබට කියනවා සමාව දෙන්න. සමාව ඉල්ලන්න. කාදිනල් වහන්සේට අපි යවපු ලිපිය උන්වහන්සේට ගොඩක් බලපාලා තිබිල තියෙනවා. අපි උන්වහන්සේගෙන් සමාව ඉල්ලමු. මට ආසයි උන්වහන්සේ එක්ක එකට ඉඳගෙන කියන්න පුලුවන් නම්. එක මොහොතකට ජනතාව අපෙන් ගිලිහිලා ගියා. ඒගොල්ලන්ට දැනුනා කවුරුත් ඒගොල්ලන්ට නැහැ ඒගොල්ලන්ගේ දුක කියන්න, ඒගොල්ලන්ගේ අසරණකම. කමක් නැහැ, අපි උන්වහන්සේගෙන් සමාව ඉල්ලමු. උන්වහන්සේට දුක හිතුනානේ. අපි සමාව ඉල්ලමු. අපිට වරද කරපු අය ගොඩක් ඉන්නවානේ මේ කාලයේ. ඒ අයට සමාව දෙමු. අපේ පෞද්ගලික ජීවිත තුළ ස්වාමි පුරුෂයා - බිරිඳ අපි යන්නාවූ ගමන තුළ.

ඒ වගේම දිළින්දාව අමතක කරන්න එපා. එක එක ව්‍යාපාරවල කරිස්මා තියෙනවා. මදර් තෙරේසා දිළිඳුන්ට ආදරේ කරපු විධිය හරි වෙනස්නේ. මම හිතන්නේ නැහැ අපිට ඒ වගේ දිළිඳුන්ට ආදරේ කරන්න පුලුවන් වෙයි කියලා. මම හිතනකොට මට එහෙම හිතෙනව. කොහොමද මේ ගඳ ගහන තුවාල සුද්ද කරල, ඒ ගොල්ලන්ව නහවලා, වඩාගෙන කන්ඩ බොන්ඩ දීලා, විශ්වාසයේ පියවරවල් අරන්

ඒ වාගේ අපේ ගමනේදී අපිට ස්වාමින් වහන්සේ කියලා තියෙන්නේ "දිළින්දන් උදෙසා දිළින්දෙක් වෙන්න" කියලා. ඒක අමතක කරන්න එපා. මුළු ලෝකය වටේ යක්ෂයා - ලෝකයා - මාංශයා අතී පොහොසත්ව ජීවත් වෙන්නට වෙර දරද්දි අපි දිළින්දන් උදෙසා දිළින්දෙක් වෙමු. ඒක අමතක කරන්නට එපා. ෆ්‍රැන්සිස් පාප් තුමා උන්වහන්සේගේ පාප් ධූරය භාර ගත්ත දවසේ උන්වහන්සේ කියනවා තිරය මත වැටෙනවලු ඡන්ද ගණන. ඡන්ද ගණන හොඳටම වැඩි වේගන, වැඩි වේගන එනකොට උන්වහන්සේ ළඟ හිටියලු විශ්‍රාමික රදගුරු හිමිපාණන් කෙනෙක් උන්වහන්සේට ඡන්දෙ නැහැලු. උන්වහන්සේ ප්‍රැන්සිස් පාප්වහන්සේට කිව්වලු, ආ ඔයා දිළින්දන්ව අමතක කරන්න එපා ඔයා පාප් වහන්සේ වුණහම, කියා කියල තිබෙනව.

වතිකාන විද්වියමනෙහි (Vatican Website) තිබෙන දේ මම කියන්නෙ. පාප් වහන්සේ පාප් ධූරයට නම ප්‍රකාශ කළා විතරයි ඒ අය ඇවිත් අසා තිබෙනව ඔබ ගන්න නම මොකක්ද කියල. ප්‍රැන්සිස්, ප්‍රැන්සිස් කියා කිව්වලු. ප්‍රන්සිස් සේවියර් ද? නැහැ නැහැ. අසීසියේ දිළිඳු ෆ්‍රැන්සිස්. උන්වහන්සේ පාප් ධූරයට ආපුවහම ආර්ථිකය භාර අයට කිව්වලු ඔතන සල්ලි ඔතන ගහගෙන ඉන්නෙ? අර දුප්පත් මිනිස්සු ඉන්නෙ ඒ මිනිස්සු ඉල්ලන්න ඉස්සෙල්ලා ඒ ගොල්ලන්ට සල්ලි දෙන්න කිව්වලු. දිළින්දාට ආදරේ කළා. අපි දිළින්දන් උදෙසා දිළින්දෙක් වෙමු.

අපි යාච්ඤා කරමු, අපේ මේ ජුබිලි වසර ශුද්ධවූ වසරක් කරදෙන්න කියා කියමු. මේ ජුබිලි වසර ක්‍රිස්තුන් වහන්සේ දෙස හොඳටම බලන, අපේ කරිස්මාවේ පළවන අත්දැකීම දේව මැණියන්ගේ හිස්වීම, දෙවන අත්දැකීම ක්‍රිස්තුන් වහන්සේ දෙස බැලීම, තුන්වන අත්දැකීම අපගේ පුත්‍රභාවය,

හතරවන එක අභිරහස්මක දෙවියන් වහන්සේ ඉදිරියේ. එහෙම නෙමේද කුරුසිය පාමුල දේව මෑණියෝ හිටියේ, අර මහා ගින්න මැද, මෙන්න ඔබේ පුතා, පුතාට කියද්දි මෙන්න ඔබේ අම්මා කියලා. දේව මෑණියෝ කෙහොම ඉන්න ඇතිද? ඒ නිශ්චලතාවය තමයි දේව මෑණියන්ට පෙනී ගියේ ඔබවහන්සේ ස්වාමියාණෝ. ඔබවහන්සේ හරි. මේ මොහොතේ ඉඳන් ඔබවහන්සේ ස්වාමියාණෝ අපේ නෑ සම්බන්දකම් මට අළුත් දෙයක්. මම විශ්වයේ ම අම්මා. ඔබවහන්සේ විශ්වයේම ස්වාමියාණෝ කියල දේව මෑණියෝ කියන්න ඇති.

එතකොට අපි භාවනා කරමු. කුරුසිය පාමුල ජේසුත් එක්ක වැඩියෙන් ඉම්මු. කුරුසිය පාමුල හිටිපු අයගෙ අත්දැකිම දෙස බලමු. ඒ වගේම අවුරුදු 50ක් පුරා අපිට ලැබුනාවූ ඉගැන්වීම්, ඒ වගේම අමතක කරන්න එපා මට මේ යාච්ඤාවට සූදානම් වෙද්දී මට ඇතුළෙන් එනවා අපෝස්තුළු වරුන්ගේ විශ්වාස ලක්ෂණය. ශුද්ධවූ කතෝලික සභාව කෙරෙහි මම විශ්වාස කරමි. අපි කතෝලිකයි. කාටවත් කියන්න බැහැ උඹලා පලයල්ලා පෙන්තකෝස්ත අය ළඟට කියලා. ඒ යූ ටියුබ් එකේ තියෙන එක, මේක හරිනම් දැන්මම ගලවන්න ඕනේ. කාටද කියන්න පුලුවන් කතෝලික සභාවට මෙච්චර ආදරේ කරන පුබුදු ජනතාවට පලයල්ලා පෙන්තකෝස්ත සභාවට කියලා. අපි දේව මෑණියන්ට මෙච්චර ආදරෙයි. සක්‍රමේන්තු වලට මෙච්චර ආදරෙයි. අපි සභාවට විරුද්ධව අපේ සිතකින්වත් සිතකින්වත් අපි සභාවට විරුද්ධව ගිහිල්ලා නැහැ. යන්නෙත් නැහැ. මේ මහා වරප්‍රසාද රාශියෙන් මේ උතුම් දවසේදී මුළු මහා පුබුදුව ආශිර්වාදයෙන් වස්වන්න කියලා අපි යාච්ඤා කරමු....!

ප්‍රීතිවන්න ප්‍රියප්‍රසාද පූර්ණවන්තයිනි.......

ජේසු පිහිටයි ! සුභ මංගලම් !

# ජුබිලි මංගල තේමා ගීතය ගායනයට හැඳින්වීම

ශුද්ධවූ සභා ඉතිහාසයට අනුව ශුද්ධ වූ සභාව බිහිවන්නේ අද වැනි මංගල්‍යය දිනක යි. පෙන්තකොස්ත මංගල්‍ය ශුද්ධවූ සභාවේ උපත යි. උපන් මංගල්‍යය යි. එලෙසින්මයි පිබිදුණු කිතුනු ජනතාවක් නැවත උපදින්නේ. "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමිඳාණෝ ය." ස්වාමියාණෝ ය, කියන ඒ මහා අනාවරණයත් සමඟයි ඔබෙයි මගෙයි ජීවිත මේ පිබිදුණු ජීවිතයට එදා නැවත ඉපදුනේ. අද පනස් වසක් ගිය තැන ශුද්ධාත්මයාණන් වහන්සේ අපට නැවතත් කතා කරනවා ඒ වචනයම මහා තේමාවක් විලසින්. "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ ය." අපට නැවත ඉපදෙන්නට ඇරයුමක්. මේ ඇරයුම ඉදිරිපිට අපගේ මේ සූදානම සප්ත ස්වරයේ රාව ප්‍රතිරාව මැද මේ වසරේ අපගේ තේමා ගීතය දොරට වැඩුමට යි. කිතු දන පුබුදු ජාතික කලා සේවාව වෙනුවෙන් සංගීත අංශය වෙනුවෙන් අද මේ රාත්‍රියේදී දොරට වඩින අපගේ ජුබිලි වර්ෂයේ තේමා ගීතයට දැන් අපි ඇතුළු වෙමු.

# ජුබිලි මංගල තේමා ගීය

අන්ධකාරයේ කඩතුරා බිඳ - ලෝ පහන් කළ සූර්යයාණෙනී

සුදත් බලයෙන් අපේ ජීවිත - පුබුදුවන ශ්‍රී වචනයාණෙනී

දේව මහිමයෙ ප්‍රභාවයෙනී - දේව ප්‍රේමයේ ස්වරූපයෙනී

පියාණන් හා අප සබැඳි කළ - උතුම් සදාතන පූජකයාණෙනී

ඔබ අබිමුව අපි පවසමු තිර ලෙස

ජේසු ක්‍රිස්තුන් වහන්සේ - අපගේ ස්වාමියාණෝ

සදාකාලයෙන් සදාකාලයට අප රජිඳාණෝ

හෝසන්නා හෝසන්නා - අප රජිඳාණෝ අප රජිඳාණෝ

අබ්බා තාත්තේ පිය අමතන්නට - උරුමය ලැබ දුන් පුත්‍රභාවයේ

ඔබනුව අප කැඳවා - කුරුසේ ගමන පිරූ කිතු සමිඳේ

බාධක පීඩා ගැරහුම් ආවත් - අධිෂ්ඨානයෙන් අපි යන්නේ

ශුද්ධාත්ම ගින්නෙන් අප අවුළා - රාජ්‍යය සඳහා යවනු මැනේ

ඔබ අබිමුව අපි පවසමු ................................

අජරාමර වූ ස්වාමිත්වය වෙත - අප දිවි අයිතිය දෙමු පවරා

මනස්ස්ථාපනය වී - කැමැත්ත සපුරමු මියෙන තුරා

සාංඝික දිවියට සාක්ෂි දරමු - ආත්මාර්ථයේ බල බිඳ දා

රාජ්‍යය සඳහා ජනතාවයි අපි - පිබිදෙමු පුබුදමු සත්‍යය දිනවා

ඔබ අබිමුව අපි පවසමු ................................

පනස් වසක් පිරි සුදතුම් ගමනේ - සමිඳුන් සිදු කළ මහත් වූ ක්‍රියා

පසසමු දෙව් අම්මා හා - ජුබිලි වසරේ නව ගමන් අරඹලා /////

## ජුබිලි සඟරාව දොරට වැඩුම

මේ මංගල රාත්‍රිය තුළ අප දැන් යොමු වන්නේ තවත් සුවිශේෂී වූ කර්තව්‍යයක් ඉටු කරන්නට යි. එදා මෙදාතුර කිතු දන පුබුදුව ලක් ශුද්ධවූ සභා මාතාවගෙ අනන්‍යතාවය එලෙසම සුරකිමින් ජීවමාන සභා සම්ප්‍රදායට ගරු කරමින් සභා සත්‍යතාවයන් පිළිගනිමින් සපැමිණි මේ ගමන් මඟ දෙස ආවර්ජනාත්මක බැල්මක් හෙළද්දී ඇතැම් විටෙක මෙය ශුද්ධාත්මාවලෝකනයක් බවට පත් වෙද්දී මේ ආවර්ජනය තුළ අපි හැරිලා බලද්දි මේ ආපු ගමන සැබවින්ම උඩුගම් බලා පිහිනීමක් වුණා. එය පෙරළියක්, එය අභියෝගයක් වුණා. එය ප්‍රතික්ෂේපයේ විරෝධයේ සළකුණක් ම වුණා. මහා සුන්දර අතීතයක් සුන්දර කාලච්ඡේදයක් බවට පත්වුණා.

ඇතැම් විටෙක ඔබට සිහි නැගේවි ශුද්ධ බයිබලයේ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් මුල් කිතුනු සංඝයේ අත්දැකීමට ශුද්ධාත්මයාණන් වහන්සේ මේ ශ්‍රී ලක් දේශය තුළ දී කිතු දන පුබුදු දරු දැරියන්ව ඔසවාගෙන සපැමිණි ගමන් මඟ. තරුණ තරුණියන්ගෙන් ඇරඹුණු මේ පෙරළිය, මේ විප්ලවය, මේ සභා පුනරුදය, මේ දේශය සිසාරා පැතිරෙන්නට වුනා.

මව්පිය ශිෂ්‍ය - ශිෂ්‍යා, සුබැඳි - සුරැඳි, සුමැදි අංශ අතික්‍රමණය කරමින් ජීවිතයේ සෑම අන්තයක් ම ආලෝකමත් කරමින් ශ්‍රී ලංකාවෙන් පමණකුදු නොනැවතී දේශ දේශාන්තරයන් අතික්‍රමණය කරමින් ඉතාලිය, ඕස්ට්‍රේලියාව, එංගලන්තය, ඊශ්‍රායලය මෙකී නොකී රටවල් සිසාරා උන්වහන්සේගේ මේ පිබිදීමේ පෙරළිය දකුණු ආසියාවේ මුල්වරට ඇරඹුණු මේ විප්ලවය මේ ශුද්ධාත්ම

ගින්න ගලා යන්නට වුණා. මේ ගමන තුළ අප මං සළකුණු තැබුවා වූ හැරවුම් ලක්ෂයන් ගණනාවයි. මේ සියල්ල දෙස ආවර්ජනාත්මක බැල්මක් හෙලපු අපේ අම්මලා තාත්තලා දුවලා පුතාලා මේ ඉතිහාසය අකුරු බවට පත්කළා. මෙය ලිඛිත ඉතිහාසය මේ රාත්‍රියේ කිතු දන පුබුදුව අඩ සියවසක් පුරාලන මේ ජුබිලි මංගල රාත්‍රියේදී සමරු කළඹ විලසින් දොරට වඩින ඒ ඓතිහාසික මොහොතටයි අප දැන් මේ සපැමිණ තිබෙන්නේ ඒ සඳහා මං ගෞරවයෙන් ආරාධනා කර සිටිනවා කිතු දන පුබුදු ජුබිලි මංගල මහෝත්සව කමිටුව නියෝජනය කරමින් මාරි දිසානයක අම්මේ, අම්මා විසින් අපගේ කිතු දන පුබුදු ජාතික දිවැසි එකතුව වෙත මේ මොහොතේ පිළිගැන්වෙන වගයි.

දිවැසි එකතුවේ රංජනා කවිරත්න අම්මේ ඩෙල්රින් වනිගරත්න තාත්තා මම ඔබ දෙපළටත් සමිඳුන් තුල ඉතාමත් ආදරයෙන් ආරාධනා කරනවා. ඔබ මේ දකින්නේ ඒ උත්කෘෂ්ට මොහොත කිතු දන පුබුදුවේ මේ අතීතාවර්ජනය ශුද්ධාත්ම අවලෝකනය ඉදිරිපිට එළිදකින මේ ග්‍රන්ථය සමරු කළඹ මුළු මහත් වූ පුබුදුව වෙනුවෙන් සමස්ත ශුද්ධවූ සභාව වෙනුවෙන් මේ මොහොතේ දී නිල වශයෙන් දොරට වඩින වගයි.

# ආලෝකයේ මෙහෙය

ප්‍රේමවන්තයෙනි,

අපගේ පනස් වන ස්වර්ණ ජයන්ති ජුබිලි මංගල මහෝත්සවයේ බලගතුම මොහොතට අපි දැන් අවතීර්ණ වී සිටිනවා. කිතු දන පුබුදුව ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් බව අපි සියලු දෙනාම පිළිග න්නවා. විශ්වාස කරනවා. අවුරුදු 50 ක් පුරා ස්වාමි තාත්තා සියලු පුබුදුවේ නායකත්වයන් මුළු පුබුදු ජනතාව වැටීම්, නැගිටීම්, අරගල, අභියෝග, බාධක මැද සපැමිණි මේ ගමන "ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කල ඔබ බලය ලබන්නාහු ය" යන දෙවියන් වහන්සේගේ ප්‍රබල වචනයේ සාක්ෂියක් නෙවෙයි ද?

එසේ නම් මේ රාත්‍රිය බලසම්පන්න පියාණන් වහන්සේගේ හා පුත්‍රයාණන් වහන්සේගේ ආත්මයාණන් වූ ශුද්ධාත්මයාණන් වහන්සේට අපි වන්දනා නමස්කාර කරන රාත්‍රියක් නොවේ ද? එමනිසා ප්‍රේමවන්තයෙනි, මේ වසර 50 පුරා මුළු පුබුදු ජනතාව අද ජීවත් වෙන, අපිත් එක්ක ජීවත් වෙලා අද ස්වර්ග සේනාව සමඟ වැජඹෙන පුබුදුවේ අම්මලා, තාත්තලා, අයියලා, අක්කලා, නංගිලා, මල්ලිලා අපි සියලු දෙනා මේ වසර 50 පුරා ආත්මයාණන් වහන්සේ අපට දුන්නු වරම්, දීමනා, වරප්‍රසාද, ආශිර්වාද අපි කොච්චර නම් අත්දැකල තිබෙනවා ද? ඒ ආත්මයාණන් වහන්සේගේ බලගතු ක්‍රියාකාරීත්වය නිසා නොවෙයි ද? එමනිසා ප්‍රේමවන්තයෙනි, අපි මේ රාත්‍රිය ආත්මයාණන් වහන්සේට ප්‍රශංසා කළ යුතු, ආත්මයාණන් වහන්සේට වන්දනා නමස්කාර කළ යුතු රාත්‍රියක්. ඒ නිසා අපි දැන් සූදානම් වෙන්නේ අපගේ පුබුදු නර්තන කණ්ඩායම සමඟ

එකමුතු වෙලා නමෝ නමෝ ශුද්ධාත්මයාණෙනී, ජය තුති මංගල සර්ව බලධාරීනි කියමින් අප සමග මේ වසර 50 පුරා බලගතුව ක්‍රියා කළා වූ ශුද්ධාත්මයාණන් වහන්සේට නර්තනයෙන් වන්දනා නමස්කාර කිරීමටයි. අපි දැන් ඊට සහභාගි වෙමු.

- **නමෝ නමෝ ශුද්ධාත්මයාණෙනි......**

**(පුබුදු ගී අංක 02)**

වසර පනහක ගමන වෙනුවෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට වන්දනා නමස්කාර කරන මෙම රාත්‍රියේ මෙම ජුබිලි මංගල මහෝත්සවය සමඟ අරඹන නව යුගයට ශුද්ධාත්ම වැගිරීමක් පතා අපි යාච්ඤා කරමු.

ආදර අම්මේ, තාත්තේ, අයියේ, අක්කේ, නංගියේ, මල්ලියේ, මේ රාත්‍රිය වෙනුවෙන් අපි වසර හතරක් පුරා මනස්ථාපනය වුණා. අපි අවංකව මනස්ථාපනය වෙලා අපි කුරුස පාමුලට ගමන් කරද්දී සමිඳාණන් වහන්සේ අප වෙනුවෙන් වැගිරෙව්ව ශ්‍රී රුධිරයේ පවිත්‍රතාවය ඔබ මම අත්දැක්කා. ඒ ගැළවීම අපි අත්දැක්කා. අයිති කර ගත්තා ඒ ගැළවීමට විවෘත වුණා. ඒ නිසා පළමු කොට මේ වසර හතර පුරා මනස්ස්ථාපනයේ අත්දැකීම හරහා සමිඳාණන් වහන්සේ ඔබට මට දුන්නු ගැළවීම වෙනුවෙන් අපි මොහොතක් ඔවුන් වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු.

- **කෙටි ප්‍රශංසාවක්**

අපි එදා මෙදා තුර අපි ආපු මේ ගමන තුළ අප වෙනුවෙන් අප සමග සිටිය අපේ අම්මා එදා කුරුස පාමුල

දී සමිඳාණන් වහන්සේ අපට තිළිණ කළ "මෙන්න ඔබේ අම්මා" භාග්‍යවන්ත අම්මා එදා කුරුස පාමුල සිටිමින් එතුමිය අපිව බාර ගත්තා සමිඳාණන් වහන්සේ එතුමියට අපව බාර කළා. එතුමිය සේනාකුළු ශාලාවේ ශ්‍රාවකයන් සමඟ සිටිමින් ආත්මයාණන් වහන්සේගේ වැගිරීම පතා ශුද්ධවූ සභාව වෙනුවෙන් යාච්ඤා කළා. ඒ නිසා ප්‍රේමවන්තයෙනි, අපි මේ මොහොතේ භාග්‍යවන්ත අම්මාව ආදර ගෞරවයෙන් යුතුව සිහිපත් කරමු.

අපගේ කරිස්මාවේ පළවෙනි අත්දැකීම භාග්‍යවන්ත අම්මා වාගේ වීම. ඒ නිසා අපි මේ රාත්‍රියේ ජුබිලි මංගල මහෝත්සවය සමඟ ඔබ මම ලබන්නට යන අලුත් පෙන්තකොස්තය වෙනුවෙන් මුළු පුබුදු ජනතාව උදෙසා යාච්ඤා කරන්නට කියලා අපි දෑත් වැඳගෙන ගෞරවයෙන් ඒ භාග්‍යවන්ත අම්මට කියන යාච්ඤාව තුන් සැරයක් කියමු.

- **ප්‍රීති වන්න ප්‍රිය ප්‍රසාද........///**

ප්‍රේමවන්තයෙනි, මේ රාත්‍රියේ සමිඳාණන් වහන්සේ අපිට බලගතු පොරොන්දුවක් දෙනවා. ආත්මයාණන් වහන්සේගේ වැගිරීමක් පතා යාච්ඤා කරන මේ රාත්‍රියේ උන්වහන්සේ අපට ජොහාන් තුමාගේ සුවිශේෂයේ 14 වන පරිච්ඡේදයේ 12 වෙනි 13 වෙනි පද.

"ඒකාන්තයෙන් ම මම එසේ ඔබට කියමි. මා අදහන්නා මා කරන ක්‍රියා ද කරන්නේ ය. තවද මා පියාණන් වහන්සේ වෙත වඩින බැවින් ඔවුහු මීටත් වඩා මහත් ක්‍රියා කරන්නේ ය. පුත්‍රයාණන් තුළ පියාණන් වහන්සේ මහිමයට පමුණුවනු ලබන පිණිස ඔබ මාගේ නාමයෙන් අයදින කවර දෙයක් වුව ද මම ඉටු කරන්නෙමි"

ස්වාමීන් වහන්සේ අපට පොරොන්දු වෙනවා මා අදහන්නා මා කරන ක්‍රියා ද කරන්නේ ය. සමිඳාණන් වහන්සේව අදහන කෙනා උන්වහන්සේ කියනවා මා කරන ක්‍රියා කරනවා. මා පියාණන් වහන්සේ සමඟ සිටින නිසා ඔබට පුළුවන් වෙනවා ඊටත් වඩා මහත් ක්‍රියා කරන්නට.

ශු.ජොහාන් සුවිශේෂය 8 වන පරිච්ඡේදයේ 37-38

"මංගල්‍යයේ අවසාන මහා දවසේ දී, ජේසුස් වහන්සේ නැඟිට හඬනඟා යමෙක් පිපාසයෙන් සිටිත් නම් ඔහු මා වෙතට පැමිණ පානය කෙරේවා. ශුද්ධ ලියවිල්ලේ කියා තිබෙන පරිදි මා කෙරෙහි අදහන්නා තුළින් ජීවනදායක ජලධාරා ගලන්නේ ය. මා අදහන්නා මහත් ක්‍රියා කරන්නේ ය."

මෙතන ස්වාමින් වහන්සේ කියනවා මාව අදහන්නා තුළින් ජීවනදායක ජලධාරා ගලන්නේ ය. ප්‍රේමවන්තයෙනි, ක්‍රිස්තුන් වහන්සේව අදහන කෙනා අත්දකින කෙනා ඒ මහා ක්‍රියාව, බලගතු ක්‍රියාව උන් වහන්සේව විශ්වාස කරන පුද්ගලයා තුළින්, උන්වහන්සේ විශ්වාස කරන ජනතාව තුළින් ජීවනදායක ජලධාරාව ඒ ගලන ජීවනදායක ජලධාරාවෙන් ප්‍රාතිහාර්ය අත්දැකීමයි. ඒ නිසා මේ මොහොතේ ස්වාමීන් වහන්සේ අපට මතක් කරනවා. ඔබ මාව අදහන තරමට ඒ මා තුළින් ගලන ජීවනදායක ජල දහරාව ඔබට අත් දකින්නට ලැබෙනවා. ඒ නිසා පනස් වසර සමරන මේ බලගතු රාත්‍රියේ ප්‍රේමවන්තයෙනි, අපි ගැඹුරු විශ්වාසයෙන් යාච්ඤා කරන්න සූදානම් වෙමු. සමිඳාණන් වහන්සේ අදහන කෙනා තුළින් ගලන ඒ ජීවනදායක ජල දහරාව, ජීවනදායක ගංගාවෙන් පානය කරන්නට අප තුළ ගැඹුරු පිපාසයක් මේ රාත්‍රියේ ඇතිකරන්නට කියලා. මේ මොහොතේ මට මතක් වෙනවා එසකියෙල් දිවැස්ප්‍රසාදිවරයා ප්‍රකාශ කරනවා දේව මාලිගාව

යටින් ගලන ජීවනදායක ගංගාවක් පිළිබඳව. ඒ වගේම එළිදරව් පොතේ තිබෙනවා ජොහාන් තුමා අනාවරණය කරනවා ඒ දේව මාලිගාව යටින් ගලන ඒ ජීවනදායක ජලධාරාව දෙවියන් වහන්සේ හා බැටළු පෝතකයාණන්ගේ සිංහාසනයෙන් ගලා එන පළිඟු මෙන් විනිවිද දිලෙන ජීවන වතුර ඇති ගංගාවයි. ඒ නිසා ප්‍රේමවන්තයෙනි මේ ජීවමාන නව ගිවිසුමේ අලුත් දේව මාලිගාව උත්ථාන වූ ජීවමාන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ යි. උන්වහන්සේගේ ප්‍රතාපවත් ශරීරය යි.

ඔවුන් වහන්සේගේ ශරීරය තුළින් ගලන ඒ ජීවන ගඟ, ජීවන ගංගාව ශුද්ධාත්මයාණන් වහන්සේ යි. උන්වහන්සේගේ ශරීරය නැමැති ඒ ශරීරය තුළින් ගලන ජීවන ගංගාවේ උල්පත එදා කුරුස ගසේ දී සිදුරු කළා වූ ඔවුන්වහන්සේගේ ඇලය යි. ඒ නිසා අපි මේ රාත්‍රියේ උන්වහන්සේගේ සිදුරු වුණා වූ ඒ ඇලය තුළින් ගලාගෙන එන ජීවන ගංගාවට විවෘත වෙලා ආත්මයාණන් වහන්සේගේ බෞතිස්මය ලබන්නට අලුත් පෙන්තකොස්තයක් ලබන්නට මොහොතක් නිශ්චලව අපි දෑස් පියාගෙන සූදානම් වෙමු.

උත්ථාන වූ ස්වාමීන් වහන්සේ තුළින් ඒ මහා ජීවන ගඟ ගලා ගෙන එන්නට යනවා. මේ රාත්‍රියේ දී ඒ ජීවන ගඟින් අපි පානය කරන්නට සූදානම් වෙමු. ඒ නිසා අපි මේ මොහොතේදී සූදානම් වෙන්නේ ඒ බලගතු අත්දැකීමට ඇතුළු වෙන්නට යි. මේ නිසා අපි සියලුම විදුලි පහන් නිවා දමා උත්ථාන වූ ස්වාමීන් වහන්සේව අපි මේ රාත්‍රියේදී අත්දකින්නට යනවා. උත්ථානවූ සමිදාණන් වහන්සේව සංකේතවත් කරමින් අපි පාස්කු ඉටි පහන දල්වන්නට යනවා. ඒ නිසා අපි මේ මොහොතේ ඔබේ නිවෙස් වලත් සියලුම පහන් නිවලා අපි පාස්කු ඉටි පහන දල්වන මොහොතේ ඔබ ඔබේ නිවසේ පොල්තෙල් පහන දල්වා ගන්න ඔබ

පොල්තෙල් පහන දල්වා ගෙන අපේ අවධානය නව දේව මාලිගාව එසකියල් දිවැස්ප්‍රසාදිවරයා කියනවා දේව මාලිගාව යටින් එළිපත්ත යටින් ජීවන ගංගාවක් ගලනවා. ඒ දේව මාලිගාව උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ යි. උන්වහන්සේගේ ප්‍රතාපවත් ශරීරය යි. ඔවුන් වහන්සේගේ ඇලය යි. ඒ ඇලය තමයි උල්පත ඒ නිසා ඒ උත්ථානවූ සමිඳාණන් වහන්සේ සංකේතවත් කරමින් මේ මොහොතේ පාස්කු ඉටි පහන දල්වන්නට මම ඉතාමත් ආදරයෙන් ගෞරවයෙන් ඇලෙක්ස් නිලන්ත පියතුමාට ආරාධනා කරනවා පාස්කු ඉටි පහන දල්වන්නට කියලා.

- **ඔබත් ඔබේ නිවෙස්වල මේ මොහොතේ පොල්තෙල් පහන දල්වා ගන්න.**

උත්ථාන වූ සමිඳාණන් වහන්සේ අපට දානය කරන ආත්මයාණන් වහන්සේගේ ඒ ආලෝකය මුළු පුබුදු ජනතාව වෙතට, මුළු පුබුදු ජනතාව ශුද්ධවූ සභා මාතාව වෙතට, අපගේ දේශය වෙතට රැගෙන යන්නට අපට තිබෙන ඒ මහා බලගතු කැඳවීම, ඒ ගමනට නායකත්වය දෙන්නට දෙවියන් වහන්සේ තෝරාගෙන තිබෙන කිතු දන පුබුදු ජාතික දිවැසි එකතුවට මේ මොහොතේ මා ගෞරවයෙන් ආරාධනා කරනවා පාස්කු ඉටි පහන තුළින් සමිඳාණන් වහන්සේගේ ඒ ආලෝකය රැගෙන පොල්තෙල් පහන දල්වන්නට කියලා. චිරාගත සම්ප්‍රදායානුකූලව අපගේ සංස්කෘතියේ සෞභාග්‍යය, සමෘද්ධිය, ආලෝකය සංකේතවත් කරන පොල්තෙල් පහන දල්වමින් මේ දේශයට ශුද්ධවූ සභාවට සමිඳාණන් වහන්සේගේ ආලෝකය රැගෙන යන්නට අපට තිබෙන කැඳවීමට ඒ ජනතාවට ආලෝකය රැගෙන යන්නට

එහි නායකත්වය ගන්නට කියා මා මේ මොහොතේ ජාතික දිවැසි එකතුවට ආරාධනා කරනවා.

- **සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම**

පාපයේ විස නසා ලූ ලෝකයේ අඳුර දුරලූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපගේ ස්වාමියාණෝ ය. පාපයේ විස නසා ලූ ලෝකයේ අන්ධකාරය අඳුර දුරලූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපගේ ස්වාමීයාණෝ ඔවුන් වහන්සේ තුළින් ගලන ජීවන ගඟ ශුද්ධාත්මයාණන් වහන්සේ යි. පුබුදු ජනතාවෙනි, නිවෙස් වල ඉඳගෙන ඔබගේ දෑත් ඔසවන්න ඉහලට, ක්‍රිස්තුන් වහන්සේ වෙතට මේ රාත්‍රියේ ඔසවන්න ක්‍රිස්තුන් වහන්සේ වෙතට ඔබේ හදවත්, විවර කරන්න ජීවමාන ක්‍රිස්තුන් වහන්සේට ඔබේ මනස, විවර කරන්න ජීවමාන ක්‍රිස්තුන් වහන්සේට මේ රාත්‍රියේ ඒ ජීවන ගඟ ගලාබසින මොහොත යි. පිබිදුණු කිතුනුවෙකු ලෙස තාත්තා කෙනෙක් ලෙස අම්මා කෙනෙක් ලෙස දුවෙක් පුතෙක් ලෙස සුබැඳි සංඝයේ සහෝදරියක් සහෝදරයෙක් ලෙස සුරැඳි අක්කා කෙනෙක් ලෙස සබැඳි සංඝයේ අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් දුවෙක් පුතෙක් ලෙස පූජක ජීවිතයට කැඳවීම ලද කෙනෙක් ලෙස පැවිදි ජීවිතයට කැඳවීම ලද කෙනෙක් ලෙස මේ රාත්‍රිය උත්ථානවූ සමිඳාණන් වහන්සේට විවෘත වී අපි යාච්ඤා කරමු. පියාණන් වහන්සේගෙන් හා පුත්‍රයාණන් වහන්සේගෙන් නික්මෙන ඒ ජීවනදායක ගංගාවට බැසලා අපි පානය කරමු. අපි උන්වහන්සේගෙන් පානය කර අපේ ජීවිතය ආලෝකමත් කර ගනිමු. ප්‍රබෝධමත් කරගමු. ඒ නිසා සමිඳාණන් වහන්සේට නමස්කාර කරන මේ ගීතය සමග අපි ස්වල්ප වෙලාවක් උත්ථාන වූ ස්වාමීන් වහන්සේට නමස්කාර කරමින් අපි යාච්ඤා කරමු. ස්වාමීනි ඔබ වහන්සේ පියාණන්

වහන්සේගෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් නික්ම එන ඒ ජීවනදායක ගංගාවට විවෘත වෙන්නට අපේ මනස පහදන්න, අපේ අභ්‍යන්තරය විවර කරන්න, මනස විවර කරන්න, පුබුදු ජනතාව අලුත් ගමනකට මේ ස්වර්ණ ජයන්තිය සමග අලුත් ගමනකට ආලේප කරන්නට කියා අපි මේ මොහොතේ මේ ගීය සමග උත්ථාන වූ ස්වාමීන් වහන්සේට නමස්කාර කරමින් යාච්ඤා කරන්න සූදානම් වෙමු.

- **සමිඳුන් සමිඳුන් මරණය ජයගත් සමිඳුන්......**

(පුබුදු ගී අංක 123)

අපි සමිඳාණන් වහන්සේට නමස්කාර කරමින් යාච්ඤා කරමු. මේ රාත්‍රියේ මුළු පුබුදු ජනතාව ශුද්ධාත්මයන් වහන්සේගෙන් ස්පර්ශ කරන්නට කියලා ස්නාපනය කරන්නට කියලා. අපි මේ මොහොතේ උන්වහන්සේට යාච්ඤා කරමු. නමස්කාර කරමු.

- **ප්‍රශංසාව......**
- **ඉටිපහන් දල්වාගැනීම**

ප්‍රේමවන්තයෙනි, අප අපගේ ඉටි පහන් දල්වා ගමු. මම දිවැසි එකතුවටත් පියතුමාටත් ආරාධනා කරනවා මේ වේදිකාව මත ඉන්න අයට ඔවුන්ගේ ඉටි පහන් දල්වාගන්නට ආලෝකය ලබාදෙන්නට කියලා.

ඒ වගේම මා මේ මොහොතේ ඉල්ලා සිටිනවා නිවෙස් වල පවුල් හැටියට කුඩා කණ්ඩායම් හැටියට එකතුවෙලා ඉන්න ජනතාව ඔබේ නිවසේ පියා හෝ සංඝයේ වැඩි මහල්ලෙක් ඒ

පොල්තෙල් පහනේ ආලෝකය රැගෙන ඔබේ පවුලේ අයට සංඝයේ අයට ඔවුන්ගේ ඉටි පහන් දල්ව ගන්නට අවස්ථාව උදා කරන්න. ඒත් සමගම අපි ශුද්ධාත්මයාණන් වහන්සේට බලගතු ගීතිකා ගායනා කරමින් අපි ඔබට ආරාධනා කරනවා ඔබ නිවෙස් හැටියට කුඩා කණ්ඩායම් හැටියට බලගතු ශුද්ධාත්ම ස්නාපනයක් පතා යාච්ඤාවට ඇතුළු වෙමින් ආත්මයාණන් වහන්සේට නමස්කාර කරමින් වසර 50ක් පුරා අපව ගෙනා ආත්මයාණන් වහන්සේට වන්දනා කරමින් නමස්කාර කරමින් ප්‍රශංසා කරමින් අදින් ආරම්භ කරන අලුත් යුගයට බලගතු ස්නාපනයක් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමියාණෝ කියමින් සාක්ෂි දරන්නට ජීවිතය පූජා කරන්නට වුනොත් ජේසු වෙනුවෙන් ජීවිතය පූජා කරන්නට වුණත් පුළුවන් බලයක් දෙන්නට කියලා සභාවට ආදරය කරන, ජීවිතයට මොනා සිදු වුණත් ශුද්ධවූ සභා මාතාව අත්නොහැර සභාව තුළ ම සිටිමින් සභා මාතාව පුබුදුවන ගමනකට අපව ආලේප කරන්නට කියලා බලගතු ශුද්ධාත්ම වැගිරීමක් පතා අපි මේ ආලෝකය බෙදාගැනීමෙන් පස්සේ ශුද්ධාත්ම ගීතිකා එක්ක යාච්ඤාවට ඇතුළු වෙමු.

- **ඉටිපහන් දල්වාගෙන යාච්ඤා කිරීම**

- **ශුද්ධාත්මයාණෙනි ශුද්ධාත්මයාණෙනි වඩින්න රැගෙන ගින්න ඔබගේ.....** (පුබුදු ගී අංක 223)

- **ඔබට පුළුවන් නිවෙස් තුළ ශුද්ධාත්ම ස්නාපනය අත්දකින ප්‍රශංසාවකට ඇතුළු වන්නට**

## විශ්වාසකයින්ගේ යැදුම්

### (1). ශුද්ධවූ සභා මාතාව වෙනුවෙන් යාච්ඤා කරමු !

අබ්බා පියාණෙනි, දේව ජනතාව නිසි මං ගැන්වීමට කැඳවුම ලද සුදුතුම් පියාණන් ඇතුළු පූජක පැවිදි සැම ශුද්ධාත්ම බලයෙන් පුරවන ලෙසත්, ක්‍රිස්තුන් වහන්සේගේ ගැළවීමේ කාර්යය ලොව තුළ ඉටු කරන්නට අවැසි විශේෂ ශුද්ධාත්ම වැගිරීමක් ඔවුන් සියළු දෙනා වෙත ලැබෙන පිණිසත් අපි ඔබවහන්සේට යාච්ඤා කරමු !

### (2). ස්වාමි තාත්තා වෙනුවෙන් යාච්ඤා කරමු !

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිතයේ දර්ශනය කර ගනිමින් ජීවිතයෙන් සාක්ෂි දරන්නට ස්වාමි තාත්තා ලද බහුල වූ වරප්‍රසාදයන් ගැන ස්තුති ප්‍රශංසා කරමු. එතුමන් තුළින් පිබිදුණු ජනතාවට හිමි වූ ජීවිත දර්ශනයට ජීවිතයෙන් සාක්ෂි දරන්නට කිතු දන පුබුදුව තුළ නායකත්වය දරන සැමදෙනාට ද පුබුදු ජනතාවට ද අවැසි ශුද්ධාත්ම වැගිරීම මේ ජුබිලි වසරේ දී ලැබෙන පිණිස අපි ඔබවහන්සේට යාච්ඤා කරමු !

### (3). ස්වර්ණ ජයන්ති ජුබිලිය වෙනුවෙන් යාච්ඤා කරමු !

වසර පනහක සුදුතුම් ගමනක පිබිදුණු ජනතාවක් රැගෙන ආ මහෝත්තම දෙව් පියාණෙනි, අප ලද අනේක වරප්‍රසාදයන් උදෙසා ඔබවහන්සේට ස්තුති ප්‍රශංසා කරමු. අභියෝග, අරගල, ප්‍රතික්ෂේපයන්, ගැරහුම්, නින්දා හමුවේ ජේසු සමිඳාණෝ අප ජීවිතයේ සමිඳාණන් බව අත් දකිමින් ගමනෙහි යෙදෙන්නට අප ලද නොමද වූ ආශිර්වාදයන්

වෙනුවෙන් තුති පුදන අතර කිසිදා නො නවතින සුදතුම් ගමනක යෙදෙන්නට අවැසි ශුද්ධාත්ම වරමින් අප බලගන්වන පිණිස අපි ඔබවහන්සේට යාච්ඤා කරමු !

### (4). කොරෝනා වසංගතය වෙනුවෙන් යාච්ඤා කරමු !

ආදර දෙවි පියාණෙනි, කිසිදු පිළිතුරක් නොමැති රෝගයකින් මුළු ලොවම වසාගෙන තිබියදී, නිශ්චලව අප දෙස බලා සිටින දෙවි පියාණන්ගේ හඬට සවන් දෙන්නට ද ඔවුන් වහන්සේ පවසන දෙය තේරුම් ගන්නටද මුළු ලොවට ශුද්ධාත්ම ප්‍රඥාව දානය කළ මැනව. එලෙසම කොරෝනා රෝගය නිසා පීඩා විඳින රෝගීන් හට සුවය ද ඔවුන්ට උපස්ථාන කරන වෛද්‍යවරුන්, හෙද හෙදියන්, සෞඛ්‍ය අංශයේ සැම දෙනා, ආරක්ෂක අංශයේ සැම දෙනා හට ද අවැසි ශාරීරික, මානසික, ආත්මික සුවය, බලය ලැබෙන පිණිසත්, රෝගීව මිය ගිය සැමගේ ආත්මයන් වෙනුවෙන් ද යාච්ඤා කරමු. මියගිය සියලු දෙනා නිසා වේදනා විඳින සෑම දෙනාට ද සිත් සහනය ලැබෙන ලෙස ද අපි ඔබවහන්සේට යාච්ඤා කරමු !

### (5). පාස්කු ප්‍රහාරය හේතුවෙන් දුක් විඳින සැම දෙනා වෙනුවෙන් යාච්ඤා කරමු !

අබ්බා පියාණෙනි, සභා මාතාව පෝෂණය වූයේ අපෝස්තුළුවරුන් හෙලූ ලේ වල බලයෙනි. අන්තවාදීන්ගේ ගොදුරු බවට පත්වෙමින් කිතුනු ජනතාව අද ද සාක්ෂි දරති. පාස්කු ප්‍රහාරයෙන් ජීවිත අහිමි වූ සැම දෙනා ලංකා කතෝලික සභාව පෝෂණය කරන්නට ප්‍රාණ පරිත්‍යාගී වූවන් ලෙස අපි සළකමු. තවමත් සාධාරණයක් ඉටු නොවූ ඔවුන් වෙනුවෙන් කඳුළු සළන නෑදෑ හිත මිතුරන් වෙනුවෙන් දෙවිඳුන් යදිමු.

එසේම මෙවැනි ව්‍යසනයන් සිදුවන තුරු වගකීම් විරහිත ලෙස ක්‍රියා කළා වූ සැමටම තමන් කළ වරද පිළිගැනීමට ද මින් ඉදිරියට එවැන්නක් සිදු නොවන්නට වගබලා ගන්නටද අවැසි ප්‍රඥාව ලැබෙන පිණිස අපි ඔබවහන්සේට යාච්ඤා කරමු. !

## (6). අප රට වෙනුවෙන් යාච්ඤා කරමු !

ආදර දෙවි පියාණෙනි, අප රට පාලනය කරන දේශපාලන නායකයින් හා රාජ්‍ය බලධාරීන් ආත්මාර්ථකාමීත්වයෙන් යුතුව තෘෂ්ණාවන්ට, ආශාවන්ට යටවී දුගී ජනතාවට සිදු කරන අසාධාරණයන් වෙත ඔබවහන්සේගේ නෙත් යොමු කළ මැනව. දුක් විඳින ජනතාවට සෙත සළසන්නට ද ඔවුන් නගා සිටුවන්නට කළ යුතු දේ නිවැරදිව ඉටු කරන්නට ද සොබා දහම සුරකිමින් රටට ආදරය කරන්නට ද ඔවුන් සැමට මඟපෙන්වන පිණිස අපි ඔබවහන්සේට යාච්ඤා කරමු.!

## කිතු දන පුබුදු තේමා ගීතයට හැඳින්වීම

අබ්බා දේව තාත්තා පුරා පැය ගණනාවක් තිස්සේ මේ මහඟු රාත්‍රියේ ආනන්දයට ඔබව මාව රැගෙන ගියා. මේ ඓතිහාසික රාත්‍රිය අඩසියවසක් පසුකළ මේ අමන්දානන්දනීය රාත්‍රියේ උන් වහන්සේගේ ප්‍රේමණීය අනාවරණයන්, ස්වර්ගීය රහස් උන්වහන්සේ පිබිදුණු ජනතාව සමඟින් බෙදාගත්තා. මුළු ලෝකයේම ජනතාව, පිබිදුණු ජනතාව මේ රාත්‍රියේ දී තාක්ෂණය හරහා මේ ස්වර්ගීය අනාවරණයන් සමග සජීවීව එකතු වුණා, මේ අපගේ සූදානම මේ ඓතිහාසික රාත්‍රියේ අවසානය සනිටුහන් කරන්නට.

කිතු දන පුබුදුව ආරම්භක දිනය ගැන නිශ්චිත සටහනක් නැහැ. ඒ දිනය අපට තාම නිශ්චිත නැහැ. නමුත් කිතු දන පුබුදුව අවසන්වන දිනය පැහැදිලි ය. නිශ්චිත ය. කිතු දන පුබුදු තේමා ගීතය ඊට පිළිවදන් සපයනවා කවදද පුබුදුව ඉවර වෙන්නේ? තේජ සිරි මහිමේ දරා කිතු රජිඳුන් වඩින තුරා අපි ආදරයෙන් බලාපොරොත්තුවෙන් බලාගෙන ඉන්න ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීම වනතුරා කිතු දන පුබුදුව දිනෙන් දින දින දිවෙන් දිවට දොරෙන් දොරට උන්වහන්සේගේ මහිමශ්‍රීයේ සාක්ෂිකාරයන් වෙමින් ඔවුන් වහන්සේගේ ස්වාමිත්වය, බලය, ජවය රැගෙන ගමන් ගන්නවා නියත යි. අපි කිතු දන පුබුදු තේමා ගීතයට අපි දැන් යොමු වෙමු.

- **පුබුදු තේමා ගීතය ගායනා කරමු .**
- **දැන් අපි අපගේ දේශයට අපගේ උත්තමාචාරය මෙලෙසින් පුදකර සිටිමු.**
- **ජාතික ගීය ගායනා කරමු.**

# ස්වරණ ජයන්ති ලාංඡනය

KITHU DHANA PUBUDUWA

GOLDEN JUBILEE
ස්වර්ණ ජයන්තිය
பொன் விழா

කිතු දන පුබුදුව මැදි කරගෙන පනස් වන ඉලක්කම තුලින් මතුවන පරවියා පනස් වසරක කිතු දන පුබුදු ගමන් මග ආරම්භයේ සිට අද දක්වාත් අදින් මතුවටත් ශු.පාවුලු තුමා රෝම වරුනට යැවු හසුනේ 8:14 යන ශුද්ධ ලියවිලි පාඨය පදනම් වූ සුදතුම් ගමන ද්වනිත කරයි. එකී ගමන ප්‍රසාද ස්නාපනයේ සහ අභිවාධි ආලේපයේ කැඳවුම පුබුදු කරමින් අරහනුයේ ශුද්ධ වූ සභා මාතාව පුබුදුවමින් ලොවට සුබාආරංචිය ප්‍රකාශ කිරීමේ දුතික ගමනකට මුල පුරමිනි.

පනස් වන ඉලක්කමේ බිංදුව මැදි කරගෙන ශුද්ධ බයිබලය සහ ශුද්ධ කුරුසිය සළකුණු කොට ඇත. ශුද්ධ බයිබලය අපට කියන්නේ කිතු දන පුබුදුව ශුද්ධ ලිවිල්ල සහ ජීවමාන සම්ප්‍රදාය පදනම්ව සභා ගුරු බලයට අවනතව ගමනක යෙදෙන බවයි. ශුද්ධ කුරුස ලකුණ එකී ගමන, "තමකම නසා කුරුසිය දරා මා අනුව එන්න" යන කුඩා රැලේ කැඳවුම අත්විදින ගමනක් බව අපට සිහි ගන්වයි.

පහේ ඉලක්කම තුලින් අත් තටු විදහාගෙන පියාඹා යන පරවියෙකුගේ පිහාටු හතරක් මතු වී දිස් වෙයි. එමගින් කිතු දන පුබුදුවට ශුද්ධාත්මයාණන් තිළිණ කළ කරිස්මාවෙහි සිව් වැදෑරුම් වරම් පදනම්ව පුද්ගලයා සහ පවුල, සමාජ, ආර්ථික, දේශපාලනික සතර පෙරළියකින් දිවැසිවර සාක්ෂි දැරීමකට අපව කැඳවා ඇති බවට ශුද්ධාත්මයාණන් වහන්සේ අපව අවදි කරවන සේක. රක්ත වර්ණයෙන් වර්ණ ගන්වා කහ පැහැති පසුබිමක නිර්මාණය කොට ඇති ස්වර්ණ ජයන්ති ලාංඡනය ශුද්ධාත්ම ගින්නෙන් ඇවිළුනු ආධ්‍යාත්මිකත්වයකින් සුපොහොසත්ව ස්වර්ණ ජයන්තිය සැමරීමට අපට ඇරයුම් කරයි. නව පෙන්ත කොස්තයක් අත්දකිමින් නව යුගයකට පා තබමු.

පුබුදු මුද්‍රණාලය
452, ජාතික බැසිලිකා මාවත, රාගම
දු.ක. : 0115288344/5 ෆැක්ස් : 0112958439
E-mail : press@pubuduwa.org